# ශක්තිය

පොදු ජන හඬේ දෝංකාරය

## එජාප ජාතික ආණ්ඩුවට ජනාධිපතිගෙන් කණේ පාරක්

එජාපය ශ්‍රීලංකා මුස්ලිම් කොන්ග්‍රසය සමඟ ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇමැති ධුර සංඛ්‍යාව වැඩිකර ගැනිමට දරන උත්සහයට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සිය විරෝධය ප්‍රකාශකර තිබේ. 71 වන නිදහස් දිනය නිමිත්තෙන් ගාලුමුවදොර පිටියේ පැවැති රාජ්‍ය නිදහස් උත්සවයේදි අගමැති රනිල් වික්‍රමසිංහ ඉදිරියේම ජනාධිපතිවරයා ප්‍රකාශ කර ඇත්තේ ජනතා ප්‍රශ්න නොසලකා හැර ආණ්ඩුවේ මැති ඇමතිවරු වැඩිකර ගැනිමට ආණ්ඩුව දරන සාදාචාර සම්පන්න නොවන උත්සහයට තමන් තරයේ විරුද්ධ වන බවය.

තැපැල් කාර්යාලය ලියාපදිංචි කරන ලදි :QD/05/NEWS/2019

වෙළුම : 17 කලාපය : 01 අන්තර්ජාල ලිපිනය : www.shakthiya.org 2019 ජනවාරි මිල රු. 30.00

# ඇමරිකානු නාවික හමුදා බලයෙන් රට අල්ලන එජාප රහස් කථා ගිවිසුම හෙළිකරනු !



ඩග්ලස්ගේ පාර්ලිමේන්තු ප්‍රශ්ණයටත් පිළිතුරු ප්‍රමාදයි





**ටිකිරි දිසානායක**

ශ්‍රීලංකා දේශ සීමාවේ ඇමෙරිකානු යුධ කදවුරක් පිහිටුවීමේ සූදානමක් පවතින බවට පැතිර යන ආරංචිය පිළිබඳව සත්‍ය අසත්‍යතාව රටට හෙලි කරන්නැයි ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ රජයට බලකරමින් සීටී.එම පෙරමුණේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර පෙන්වා දෙන්නේ ඇමෙරිකානු නාවික හමුදාවට අයත් නොයෙක් භාණ්ඩ ද්‍රව්‍ය සහ ,වෙනත් දේ, ඇමරිකන් ප්‍රවාහන ගුවන් යානා මගින් කටුනායක ගුවන් තොටුපොළට ගෙනවිත් එතැනින් ත්‍රිකුණාමල මුහුදේ නවතා ඇති යුධ නැවකට එම නැවේ සිට ගුවනින් ගුවන් යානා මගින් එම භාණ්ඩ ගෙනයාමට අවසර දී ඇත්තේ කුමන පදනමකින්ද **2 පිටුවට**

## පලාත් සභා මැතිවරණයට ජනපති මැදිහත්වීමෙන් ආණ්ඩුව අර්බුදයක

**බුද්ධිශාන් ජයසිංහ**

දැනට විසුරුවා හැර ඇති පලාත් සභා 06ක සහ ලබන මස විසුරුවා හැරීමට නියමිත පලාත් සභා 03ක ඡන්ද විමසීම පැරණි ක්‍රමයට සිදුකලහැකිද යන්න පිළිබඳව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීමට සූදානම් වේ. පලාත් සභා මැතිවරණය මැයි 31වනදිනට පෙර පැවැතිය යුතු බවට ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩල සංදේශයක්ද ඉදිරිපත් කර ඇත.

පලාත් සභා විසුරුවා හැර තිබීම නිසා මේ වන විට එම පලාත් වල පරිපාලන කටයුතු වලට බාධා ඇති වී ඇති බවට ජනතාව චෝදනා කරයි. ආණ්ඩුවේ මේ සම්බන්ධයෙන් කිසිවක් පවසන්නේ නැත. පලාත් සභා විසුරුවා හැරියානම් එහි ඡන්දය පවත්වන්නට වහාම ක්‍රියාකල



යුතුය. ආණ්ඩුවේ ඇතැමෙක් කියන්නේ ප්‍රථමයෙන් මහමැතිවරණයක් පැවැත්විය යුතුයි යන්නය. එජාපයේ ඇතැම් මැති ඇමතිවරු ජනාධිපතිවරණයක් ඉල්ලා සිටිති. **2 පිටුවට**

## ජනාධිපති අපේක්ෂක කථාවට මහින්දගෙන් තහංචියක්

**ටිකිරි දිසානායක**

ජනාධිපති අපේක්ෂකයා පිළිබදව ජනතාවට විවිධ කරුණු ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටින්නයි ශ්‍රීලංකා පොදුජන පෙරමුණේ නායක, විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවවාද කර තිබේ. මහින්ද රාජපක්ෂ විපක්ෂ නායක වරයාගේ ප්‍රධානත්වයෙන් ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කාණ්ඩායමේ රැස්වීම පසුගියදා විජේරාමේ පිහිටි ඔහුගේ නිල නිවසේදී පැවැත්විණි. එහිදී මන්ත්‍රීවරුන් **2 පිටුවට**



## බඩගොස්තරවාදී ආණ්ඩුව මැතිවරණ කල් දමා මැති ඇමති වරප්‍රසාද පස්සේ පන්නයි

**අනිල් ගමගේ**

පාර්ලිමේන්තුවේ සුළුතර ආණ්ඩුවක් පැවතීම නිසා මහජනතාවගේ සුභසාධනයට වඩා ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ සුභසාධනය සඳහා ආණ්ඩුව කැපවී සිටින බව විපක්ෂය චෝදනා කරයි. විශේෂයෙන් රට තුල සේනා දලඹුවාගේ ප්‍රශ්නය, වරාය අධිකාරියේ ප්‍රශ්නය, රුපියල අව ප්‍රමාණය වීමේ ප්‍රශ්නය, යන ආදී බරපතල ප්‍රශ්න රටේ මතුවී එවායින් ජනතාව පිඩා විදිද්දී එවැනි ප්‍රශ්න වලට විසදුම් සෙවීම වෙනුවට ආණ්ඩුවේ ඇමැති මණ්ඩලය වැඩි කර ගැනිමට පාර්ලිමේන්තුවට යෝජනා ඉදිරිපත් කර ඇතැයි විපක්ෂය පෙන්වා දෙයි. රටේ නිතී සම්පාදනය කරන්නා පාර්ලිමේන්තුව වුවද මේ වන විට එය කිසිඳු නිතීයක් සම්මත නොකරන මන්ත්‍රීවරුන්ට පඩි පමණක් ගෙවන ආයතනයක් බවට පත්වී ඇති බවට දේශපාලන විශ්ලේෂකයන් පෙන්වා දෙති. දේශපාලන විශ්ලේෂකයන් පෙන්වා දෙන්නේ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඇති අර්බුදය ආණ්ඩුව බඩගෝස්තර වාදින්ගේ තොතැන්නක් බවට පත්කර ඇති බවයිග පාර්ලිමේන්තුව රැස්වන්නේ අවුරුද්දකට සිමිත **2 පිටුවට**

## රනිල් ගෙදර ?

එජාප නායක රනිල් වික්‍රමසිංහ දේශපාලනයෙන් විශ්‍රාම ගැන්විමේ රහස් වැඩ පිළිවෙලක් එජාප තුලින්ම ක්‍රියාත්මක කර ඇති බව ශක්තියට වාර්තාවේ. පාඨලි චම්පික අමාත්‍යවරයා සහ එජාප නියෝජ නායක සජිත් ප්‍රේමදාස මෙම වැඩපිළිවෙලේ ඉදිරියෙන් සිටින බවට චෝදනා එල්ලවී තිබේ. මේ සම්බන්ධයෙන් එජාපයේ මහලේකම් අකිල විරාජ් කාරියවසම් හා එජාපයේ හිටපු මහ ලේකම් කබීර් හසිම් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට මේ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති බවද දැන්ගන්නට ඇත. පාඨලි සහ සජිත් මීලගට පත්වන එජාප ආණ්ඩුවක ජනාධිපති හා අගමැතිවිමේ බලාපොරොත්තුවෙන් රනිල් වික්‍රමසිංහට එරෙහිව පක්ෂය තුල සීතල යුද්ධයක් ආරම්භ කර අති බවද මෙම තොරතුරු වලින් අනාවරණය කර තිබේ.



# ශක්තිය

49/1, විනයලංකාර මාවත, කොළඹ 10.
ෆැක්ස්/දුරකථනය 0112684820
විද්‍යුත් තැපැල: shakthiya85@gmail.com
වෙබ් අඩවිය: www.shakthiya.org


# ආණ්ඩු විරෝධී බලවේග එකට එක්වව්

මීලඟ ආණ්ඩුබලය ලබා ගැනීම සඳහා යූ.ඇන්.පී. විරෝධී ජනතා කඳවුර මහා සන්ධානය ප්‍රකාශයට පත්වන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියි. පාර්ලිමේන්තු විපර්යාශයක් මගින් ආණ්ඩුබලය අත්පත් කර ගෙන මහ මැතිවරණයක් පවත්වා ජනතා පරමාධිපත්‍ය උද්දීපනය වන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් නැවත ස්ථාපිත කිරීමට ජනාධිපතිතුමා සහ ඒකාබද්ධ විපක්ෂය ගත් උත්සාහය ජනතාව නොසිතූ ආකාරයෙන් ව්‍යවර්ත වූයේය.

මෛත්‍රී - මහින්ද ආණ්ඩුවට විරුද්ධව දක්ෂිනාංශික ඒකරාශීවීමද, බටහිර තානාපති බලයද, ජනමාධ්‍ය අයිතිකරුවන්ගේ බියවද්දන ප්‍රචාරයෙන්ද, අමතරව යූ.ඇන්.පි.ය ගොඩනැගූ ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජිතයෙක් මහ ඡන්දය පැවැත්වීමට එරෙහිව උසාවියට පෙත්සම් ද ඉදිරිපත් කර තිබුනි. එම බලපෑම් සියල්ල නිසා අධිකරණයේ තහනම් නියෝගයන්ටද, මහමැතිවරණයක් පැවැත්වීම වැලැක්වීමට උසාවිය ගත් තීරණයන්ට ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව වෙනුවෙන් හිසනැමීමට දින 52 ජනතා ආණ්ඩුවේ අගමැති මහින්ද මහතාට සිදු විය.

එයින් පසු නැවතත් යූ.ඇන්.පී. බලය ස්ථාපිත වුවත්, මෙදා හැදුන යූ.ඇන්.පී. ආණ්ඩුව කිසිදු වැඩකටයුත්තක් කර ගත නොහැකි බහුතරයක් නොමැති දෙගොඩ දෙවාරයේ පාන්කඩ ආණ්ඩුවකි. නැවත රනිල් මහතා අගමැතිකමට පත් කිරීමේදී ජනපති මෛත්‍රී මහතා ඉදිරිපත් කළ බරපතල චෝදනා පත්‍රයට යූ.ඇන්.පී.ය හෝ අගමැති රනිල් මෙතෙක් පිලිතුරක් දී නැත.

වර්තමානයේ ආණ්ඩු විරෝධී ජනතා බලවේගය කඳවුරු කීපයක ගොනුවී තිබේ. එය පොදුජන පෙරමුණ පක්ෂය, සමජවාදී ජනතා පෙරමුණ, වාමාංශික, ප්‍රගතිශීලී ජාතිකවාදී පක්ෂ ගණනාවක එකමුතුවකි. එම සියලු දෙනා එක්ව ඒකාබද්ධ පොදු ජන පෙරමුණ ලෙස පොහොට්ටුව ලකුණින් ඉදිරිපත්ව පසුගිය පළාත් පාලන මැතිවරණයේදී 43% ක සමස්ත ඡන්දයක් රටපුරා ලබා ගත්තේය. එසේම සිරිසේන ජනාධිපතිගේ නායකත්වයෙන් පවතින ශ්‍රී ල.නි.ප. හා එක්සත් ජනතා නිදහස් සන්ධානය එම පළාත් පාලන ඡන්දයේදී රට පුරා 15% මැතිවරණ ජයක් හිමිකර ගත්තේය.

මහින්ද-මෛත්‍රී නායකත්වය එක්වීම නිසා මෙම බලවේගය දැන් 58% ඡන්ද පදනමක් පෙන්නුම් කරන අවිවාදිත බලයකි. එනිසා යූ.ඇන්.පි.යට ජයක් ගත හැකි වන්නේ මෙම බලවේගය බෙදීමට හැකි වුවොත් පමණි. එයට දැනටමත් ශ්‍රී ල.නි.ප. හා පොදු ජන පෙරමුණ තුල බෙදීම් ඇති කිරීමට උත්සාහයන් පවතින බව පෙනෙන්නට තිබේ.

මහා සන්ධානය ගොඩ නැගීම පිලිබඳව නායකත්වයේ එකඟතාවය ඇතිවී තිබේ. නමුත් පොදු ජන පෙරමුණු පාර්ශවය හා එක්සත් ජනතා නිදහස් සන්ධාන පාර්ශවය අතර තවමත් සමහන් නොවුනු කරුණු කීපයකි. තනි නායකත්වයක් ලෙස මහින්ද මහතා ඉදිරියට දමා ගැනීමට පිරිසක් සැරසෙන අතර, ඒකාබද්ධ නායකත්වයක් පැවතීම පිලිබඳව පොදු එකඟතාවක් පවතී. එසේම පොහොට්ටුව ලකුනින් සියලු දෙනා එක් විය යුතු බව සමහරෙක් සිතන අතර, අනෙක් පිරිස යෝජනා කරන්නේ සුදුසු පොදු ලකුණකින් ජයගත හැකි බවය. මෙහිදී පසුගිය කාලය පුරා සන්ධාන ගොඩනැගීමේදී පෙන්නු ආදර්ශය වැදගත්ය. ඡන්දයේදී ප්‍රධාන වන්නේ ලකුණ නොව ජනතාවගේ ජයග්‍රාහී එක්සත් මාවත බව ඔප්පු කර තිබේ.

දිස්ත්‍රික් මනාප ඡන්ද ක්‍රමය නිසා එක් එක් අයගේ තේරීපත්වීමේ පුද්ගලික අභිලාශයන්ද පොහොට්ටු ලකුණ තුල පවතින බව නොරහසකි. එනිසා සියලු දෙනා පොහොට්ටු නායකත්වයට එක් කර ගැනීමට සැරසීම නොගැලපෙන උත්සාහයකි. යූ.ඇන්.පි.ය පැරදවීම මූලික කරුණ ලෙස සලකන්නේ නම් සියලු දෙනා පරිත්‍යාගශීලීව මහා සන්ධානයට එක් විය යුතුය. බෙදී තරඟ කිරීමට යෝජනා කිරීම යූ.ඇන්.පි.ය පසුපස යනදිවි නසාගැනීමකි.

පොදු ජනතාව බලා සිටින්නේ මහින්ද-මෛත්‍රී නායකත්වය දැනටමත් ප්‍රායෝගිකව පෙන්නුම් කර දී ඇති ආකාරයට සුභසාධන රාජ්‍ය රටාව තහවුරු වන සමාජ ආර්ථික වැඩපිලිවෙලක් සහිතව මහා සන්ධානය ප්‍රකාශයට පත් කරන තෙක්ය. මෙහිදී බටහිර විදේශීය බැංකු හා ඔවුන්ට අනුගත ජාත්‍යන්තර සගයන්ගේ බාධකයන්ට එරෙහිව කාලාපීය එක්සත්කම හා ජාත්‍යන්තර මිතුරු බලවේග සමීප කර ගැනීමෙන් එම බොහෝ ගැටළු නිරාකරණය කර ගත හැකිවේ.

# ප්‍රංශයේ පුරවැසි නැගිටීමෙන් පැරිසිය ගිණි ගනී









විදෙස් පුවත්

▪ ටිකිරි දිසානායක

ප්‍රංශ ජනපති එම්මානුවෙල් මැක්රොන්, නැපොලියන් බොනපාට්ගෙන් ඇරැඹුණු විධායක ජනාධිපති පරම්පරාවේ 25වන ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දුන්නේය. 41 වියැති තරුණ ආර්ථික මුල්‍ය විශේෂඥයකු, බැංකුකරුවකු හා රජයේ ඉහළ පරිපාලන නිළධාරියකු වු මැක්රොන් ජනාධිපති ගැන ප්‍රංශ ජනතාව තුල නව අපේක්ෂා ජනිත විය. එහෙත් අවුරුද්දක් ගතවීමටත් ප්‍රථම ඔහුට විරුද්ධව එරට ජනයා නැගී සිටින්නට විය.

පැරිස් නුවර හා ප්‍රත්‍යන්ත පලාත් වල ජනයා මැක්රොන්ගේ ජනතා විරෝධී පාලනයට එරෙහිව ඔවුහු නවතම ආරකින් විරෝධතාවයන්හි යෙදෙමින්, කහපැහැති කෙටි කබා පැලඳ විරෝධතාවයන්ට එක්විය. ප්‍රංශ බලධාරීන් එය හඳුන්වනු ලැබුවේ, හුදු විරෝධතා ව්‍යාපාරයක් නොවන කැරැල්ලක් වශයෙනි.

ප්‍රංශයේ විරෝධතා ආරම්භ වුයේ ලෝක ඉන්ධන මිල පහල වැටෙද්දී ප්‍රංශයේ ඉන්ධන මිල අධිකවීමට එරෙහිවය. ජාත්‍යන්තර මිල පහල වැටුනත් එහි වාසිය ජනතාවට නොදී අධික බදු පැනවීමට ප්‍රංශ රජය ක්‍රියාකිරීමත්, විශ්‍රාමිකයින්ගේ වැටුප් වලින් අධික බදු අයකිරීම, විදුලි ගාස්තු ඉහල දැමීමත්, ගැස් මිල වැඩි කිරීමත්, වරිපනම් බදු, නාගරික බදු, ආදායම් බදු, පරිසර බදු ඉහල දැමීමත් සමඟ ධනවතුන්ගෙන් අයකරන බදු කපාහැරීමටත් එරෙහිවයි.

පසුව වැටුප් වැඩි කිරීමේදී අධ්‍යාපනය සඳහා අයකරන ගාස්තු අඩුකිරීමද, ඊට ඇතුලත් කෙරින. 2018 දෙසැම්බර් 17 දින සිට සෑම සති අන්තයකම විරෝධතාවන්හි යෙදෙමින් ප්‍රංශය ගිණියම් කරන අයුරු මාධ්‍ය මගින් දුටුවෙමු. ඊලඟ සති අන්තය වනවිට තුන්ලක්ෂයක් ඉක්මවන විරෝධතා ව්‍යාපාරයක් ප්‍රංශයේ පැරිස් නුවර ආරම්භ විය. පැරිසියේ ප්‍රධාන මාර්ග සියල්ල අවහිර කරන ලදි. විරෝධතා උත්සන්න වීමෙන් පසු පරිසර ඇමැති නිකලොස් හුලොට් සිය අමාත්‍ය ධූරයෙන්ද ඉල්ලා අස්විය. ප්‍රංශ ජනාධිපති ඉල්ලා අස්වන ලෙසටත් උද්ඝෝෂකයන් බලකරන ලදි. මෙකී උද්ඝෝෂණ වලට දේශපාලන හෝ සංවිධාන නායකයින් නොවු අතර, චේන්ද්‍රිය සිවිල් ජනතා පෙලගැස්ම විශේෂත්වයකි. විරෝධතා ව්‍යාපාරය පිළිබඳව ව්‍යාජ ප්‍රවෘත්ති පලකල මාධ්‍ය ආයතනයක්ද වටලන ලදි. මග දෙපස තිබුණු වහාන ගිනිබත් විය. ගොඩනැගිලි බිඳවැටීන. පොලීසිය විසින් විරෝධතාකරුවන්ට කඳුළු ගෑස්, ගම්මිරිස් දුම් විදින ලදි. පොලිස් ප්‍රහාර වලින් 05 දෙනෙකු මිය ගොස්, දහස් ගණනක් අත්අඩංගුවට ගෙන තිබේ.

මෙකී විරෝධතා හමුවේ මැක්‍රොන්ට හිස නමන්නට සිදුවිය. දෙසැම්බර් 10 වන දින ජාතික නාලිකාවකින් ජාතිය ඇමතු ඔහු, ඇ.ඩො 100ක්වන 7% ක වැටුප් වැඩිවීමක් ලබාදෙන්නටත්, ඉන්ධන බදු සහ අනෙකුත් බදු අඩුකරන්නටත්, විශ්‍රාමික වැටුප් වලින් බදු අයකිරීම අත්හිටුවන්නත් 2019 ජනවාරි මස සිට පියවර ගන්නා බවට ප්‍රතිඥා දෙනු ලැබීය.

එහෙත් තමන්ගේ ඉල්ලීම් සියල්ල ඉටුකරන තුරු විරෝධතා අත්හිටුවන්නේ නැතිබව විරෝධතාකරුවන් ප්‍රකාශකර ඇත. මෙම ජනතා නැගිටීම සඳහා උද්ඝෝෂණය ජනිත වුයේ ප්‍රංශ ඉතිහාසයේ නොමැකෙන සටහනක් තැබූ ප්‍රංශ විප්ලවයේ සහ පැරිස් කොමියුනයෙන්ය.

## පලමු පිටුවෙන්

### ඇමරිකානු නාවික හමුදා...

යන්න රජය රටට හෙලි කලයුතු බවය.
ශ්‍රී ලංකාව හා ඇමෙරිකාව අතර අත්සන් කර ඇති ගිවිසුම් කිහිපයක් පිළිබඳව මුලින්ම රට හමුවේ අදහස් ඉදිරිපත් කළ ශ්‍රීලනිප ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර සඳහන් කළේ ත්‍රිකුණාමල වරාය අවට මුහුදේ නවතා ඇති ඇමරිකානු නාවික හමුදාවට අයත් යුධ නැවකට අවශ්‍ය භාණ්ඩ හා "වෙනත් දේ" කටුනායක ගුවන් තොටුපොළ හරහා රැගෙන ඒමට රජය අවසර දී ඇති බවය. එහෙත් රැගෙන එන කිසිවක් පරික්ෂා කිරීමට ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළ ආරක්ෂක නිලධාරීන්ට හෝ රේගුවට හෝ බලයක් නැති බව පාර්ලිමේන්තු මන්ත්‍රී පූජ්‍ය රතන හිමියන් පෙන්වා දී තිබුණි. ඇමරිකානු තනාපතිනියගේ ප්‍රකාශයෙන් මෙම කරුණු සනාථ විය. රාජ්‍ය ආරක්ෂක ඇමතිවරයා ලෙස ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් රටට ප්‍රකාශයක් කළ යුතු බවද රටේ ජාතික ආරක්ෂාවට මේ නිසා තර්ජනයක් ඇතිවී තිබෙන බවද, මන්ත්‍රීවරයා පෙන්වා දෙන්නේය.

පාර්ලිමේන්තු පක්ෂ නායකයින්හට ප්‍රශ්න විමසීමට නියමිත අවස්ථාවේ ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමා ජනවාරි 25 වන දින මෙම ප්‍රශ්නය මතු කරන ලදි. රජය ඒ සඳහා පිළිතුර දීමට කල්ගනු ලැබිණ.මිටත් වඩා දුරදිග යන වැඩපිළිවෙළක් සඳහා අපගේ විදේශීය කටයුතු අමාත්‍යාංශය සහ ලංකාවේ ඇමරිකානු තනාපති කාර්යාලය අතරේ දැනුදු සිදුවෙමින් තිබෙන ලේඛන අනුමැතිය කැබිනට් මණ්ඩලය නොදන්නා බවද ආරංචි මාර්ග කියයි.

### පලාත් සභා මැතිවරණයට...

විශේෂයෙන් පලාත් සභා මගින් පාලනය වන පරිපාලන ඒකක තිබේ.

පාසල්, රෝහල් වැනි ජනතාවගේ පොදු ස්ථාන ඊට අයත් වේ. පලාත් සභා විසුරුවාහැර තිබීම නිසා මේ ස්ථාන වල වැඩ කටයුතු වලට බාධා එල්ල වී ඇත. එවැනි ජනතාවට සේවා සපයන ස්ථානයන් වසා දමා ඇති බවට ශක්තියට පසුගියදා වාර්තා විය.

නියමිත සේවක සංඛ්‍යාවක් සහ වෛද්‍යවරුන් නොමැතිකමින් බලංගොඩ රෝහලේ දැඩි සත්කාර ඒකකය දැන් වසා දමා ඇත. මෙවැනි ජනතාවට හිතකර ස්ථාන වැසීයාමට එක් හේතුවක් ලෙස පලාත් සභා සක්‍රියව නොතිබීමද, ඒ පලාත් වල ජනතාව පෙන්වා දෙති. පලාත් සක්‍රියව නොමැති නිසා ජනතාව සේවා සපයන ස්ථාන මෙසේ වැසී යන තෙක් ජනතාව බලා සිටිය යුතුද?

ජනතාව චෝදනා කරන්නේ එජාපය පසුගිය කාලය පුරාම මැතිවරණ සිතියම හකුලා කටයුතු කරන බවයි. කෙසේ නමුත් විපක්ෂය පවසන්නේ, එජාපය මැතිවරණ සිතියම හකුලනවා නම් ඊට මහපාරේ විරෝධය දැක්වීමට සුදානම් බවයි.

### බඩගොස්තරවාදී ආණ්ඩුව...

දින ගණනකි. බොහෝ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේ බොහෝ සැසිවාර වලට සහභාගි නොවන බවද ප්‍රසිද්ධ රහසකි. එසේ වුවද ඔහුන්ගේ මාසික දීමනා හා වරප්‍රසාද කප්පාදු නොවේ. මේ බඩ ගෝස්තර වාදීන් මැතිවරණ කල දමන්නේ මෙවැනි වාසි දායක තත්වයක් මතු කිසි දිනක ඔවුනට නොලැබෙන බව ඔවුන් දන්නා නිසාය. එසේ වුවද ජනතා පරමාධිපත්‍යය වෙනුවෙන් මහා මැතිවරණයක් දිනා ගැනිමට ජනතාව සමඟ පෙලගැසී පාර්ලිමේන්තුවේදී සහ ඉන් පිටත්දී නොනවතී අරගල කරන බව විපක්ෂය සඳහන් කරයි.

### ජනාධිපති අපේක්ෂක...

කිහිපදෙනෙකුඉදිරි ජනාධිපති අපේක්ෂකයා පිළිබඳව මහින්ද රාජපක්ෂගෙන් කරුණු විමසීමේදි ඔහු සඳහන් කර ඇත්තේ ජනාධිපතිවරණයට පෙර පැවැත්විය යුතු පලාත් සභා මැතිවරණය පිළිබඳව ජනතාව දැනුවත් නොකර ජනාධිපතිවරණය පිළිබඳව විවිධ මත ජනතාව අතරට ගෙනයාමෙන් වැලකී සිටිය යුතු බවය. ජනාධිපතිවරණයේ අපේක්ෂකයා කවුද යන්න නියමිත වේලවට සියලුදෙනා එක්වී සාකච්ඡා කල හැකි බවද, එහිදි වඩාත් සුදුසු පුද්ගලයා ජනාධිපති අපේක්ෂකයා ලෙස තෝරාගත හැකි බවද, මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරුන්ට පෙන්වා දී තිබේ.

# යූ.ඇන්.පි. ආණ්ඩුව දෙමල ජාතික සන්ධානයේ කොක්කේ එල්ලයි

මාසයකට ආසන්න කාලයක දැඩි නියඟයක් රටපුරා පැතිර යමින් තිබේ. තැන තැන වර්ෂාවක පෙර නිමිති තිබුණත් මහ කන්නයේ නෙලීම් ආරම්භ වන බැවින් නවම් පොහොය පසුවෙන තෙක් තවත් ටික කලක් පැවිලි කාලගුණය දිග් ඇදෙයි. දේශපාලන බිමේද ඇත්තේ දිග් ඇදෙන වටපිටාවකි. එකතැන හිරවූ යූ.ඇන්.පි. ආණ්ඩුව කිසිම දෙයක් කර කියා ගත නොහැකිව වෙදගෙදර ලෙඩෙකු වත්තම් කර ගෙන පයින් යන ගැමියෙකුගේ සේයාවක් පෙන්නුම් කරයි. ජන බිමේ තැනින් තැන යූ.ඇන්.පී. විරෝධී මිලඟ පියවර ගැන සාකච්ඡා කරන අතර, ඒකාබද්ධ විපක්ෂය තවමත් සිටින්නේ ජනතාවගේ උවමනාවට පසු පසින්ය.

## වතු කම්කරු සටන අතරමඟ

මාස තුනක් තිස්සේ දිග් ඇදෙමින් පැවති රු. 1000/- වැටුප් වැඩිකර ගැනීමේ අරගලය රු.700/-ක සමතයකට පත් වූ බව ඇතැම් සමිති ප්‍රකාශ කලත් ඇත්ත තත්වය නම් ශුද්ධ ලෙස සේවකයින්ගේ අතට ලැබෙන්නේ රු. 50කට අඩු මුදලකි. මෙතෙක් කලක් ලබා දී තිබුණු පැමිණීමේ දීමනාව, හා ඵලදායිතා දීමනාවද කපා හැර ඇති අතර, ආර්ථසාධකයට හා සේවක භාරකාර අරමුදලට ගෙවන ස්වාමියාගේ ප්‍රමාණයද වැටුප් වැඩි කිරීමට මින් පෙර නොවූ ලෙස ගණනය කර තිබේ. එනිසා සටන්කාමී වෘත්තිය සමිති මෙම එකඟතාව හඳුන්වන්නේ පාවාදීමක් ලෙසය. මෙම එකඟතාවය ඇති කර ගැනීම සඳහාද රජයෙන් රුපියල් මිලියන 150ක ණය ආධාරයක් වතු සමාගම්වලට ගෙවීමට අවසානයේ ආණ්ඩුව එකඟවූ බවද ප්‍රකාශයට පත් විය. මෙයට විරෝධය දක්වමින් එක් අමාත්‍යවරයෙක් ප්‍රකාශ කර ඇත්තේ තේ සමාගම් පාඩු ලබනවා නම් එම වතු ආපසු රජයට භාර දෙන ලෙසද ඉල්ලා තිබේ. මේ අතර රාජ්‍ය අංශයේ සහකාර කළමනාකරණ ක්ෂේත්‍රයේ ඉහල මාණ්ඩලිකයින්ට ගෙවන දීමනාව අනුව පහල සේවකයින්ටද දීමනාවක් දිනා ගැනීමේ වෘත්තීය අරගලය තියුණු වෙමින් පවතී. ඔවුහුද රට පුරා උද්ඝෝෂණ මාලාවක් පවත්වමින් නගර අවහිර කිරීමේ සටන් ක්‍රියාදාමයකට අවතීරණ වී සිටිති.

## යූ.ඇන්.පි.යේ ඔරුමිත්තු නාඩුව

මෛත්‍රී - රනිල් එකමුතුවෙන් මධුසමය ගතකල කාලය තුල මෛත්‍රීගේ දේශපාලනය අවසන් කිරීමට යූ.ඇන්.පි.ය එලූ මරුවැල්, දෙදෙනාගේ විරසකයෙන් පසු එකින් එක එලියට ඇදෙමින් ඇත. ඒවා සමහරක් යූ.ඇන්.පී.යේ ගෙලවටද එතෙමින් තිබේ. බටහිර අධිරාජ්‍යවාදීන් විසින් යූ.ඇන්.පී.ආණ්ඩුව දෙමළ ජාතික සන්ධාන කොක්කේ එල්ලා ඇති බව රනිල්ට පමණක් නොව මුළු පක්ෂයටම දැනෙයි. විදේශිකයෝ තම උවමනාවන් ඉටු කර ගැනීමට කෙකි ප්‍රහාරයන් එල්ල කරති. එම වේදනාවෙන් රනිල් හා යූ.ඇන්.පී. ආණ්ඩුව ඇඹරෙයි. නව ව්‍යවස්ථාවේ හැඩරුව එලිදැක්වූයේ ඒ අනුවය. රනිල් කිසිදා පන්සලට යටත් නොවුනත් මෙදා තනි කකුලකින් දන නමා මහනාහිමිවරුන් බැහැදකියි. ඇමතිවරු මල්වතු අස්ගිරි නාහිමිවරුන් බැහැදැක රට නොබෙදන බවටත්, ඔරුමිත්තුනාඩුවක් නැති බවටත්, බුද්ධාගමට හිමි තැන අහිමි නොකරන බවටත් කියමින් හතර අතට වැලපෙමින් ජනමාධ්‍ය අමතති.

## දෙමළ ජනතාව විදේශික දංගෙඩියට

දෙමළ ඩයස්පෝරාවේ බෙදුම්වාදී උවමනාව ඉදිරියට ගෙන යාමට නම් රනිල් පෙඩරල් ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමේ යෝජනා පාර්ලිමේන්තුවට ගෙන ආ යුතුය. පසුගිය අර්බුද සමයේ රනිල් බේරා ගැනීමට දෙ.ජ.ස.ය ඡන්දය දුන්නේ ඒ පොරොන්දුව පිටය. අලිකෙලියට උදව් කිරීමට ගොස් විපක්ෂ නායක බූල් කෝට් එක නොසිතූවිරූ අයුරින් ගැලවීයාම ගැන සම්බන්ධන් අඬා වැටෙයි. එය පාවාදීමක් බව දෙමල බෙදුම්වාදී විදේශික සටන්කාමීන් කල්පනා කරයි. එහි ප්‍රකාශකයා ලෙස දෙමළ ඩයස්පෝරාවට ඉංග්‍රිසියෙන් අමතනු ලබන්නේ සුමන්දිරන්ය. සම්බන්ධන් කටයුතු කරන්නේ නායකයෙකුට වඩා ඩයස්පෝරාව පසුපස ඇදීයන අනුගාමිකයෙක් ලෙසය. එයට හේතුව වී ඇත්තේ ඔහු එල්.ටී.ටී.ඊ පාලන සමයේදීත් ජීවිතය පමණක් නොව පක්ෂ නායකත්වයද බේරා ගත්තේ ඊලම් තුවක්කු බලයට හිසනැමීමෙනි. ටී.එන්.ඒ. නඩය දෙමළ ජාතිකවාදය පාවිච්චි කරමින් ශ්‍රී ලාංකික දෙමළ ජනතාව විදේශික දංගෙඩියට දැක්කීමට නැවතත් පිඹුරුපත් සකසමින් සිටී.

## ආක්‍රමණයකට දොර විවර කරයි

රටටත්, ජනතාවටත්, අමාත්‍ය මණ්ඩලයටත්, පාර්ලිමේන්තුවටත්, හොරෙන් රනිල්ගේ ගැසූ යටිකූට්ටු ඇමරිකානු මිලිටරි ගිවිසුම ක්‍රියාත්මකවීම ඇරඹී තිබේ. මෛත්‍රී අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස තබා ගනිමින් ඔහුගේද ඇස්වසා ගැසූ රහස් ගිවිසුමේ වගතුග දැන් ඇමරිකානු තානාපතිනිය මගින් එලිදරව් වෙමින් ඇත. ඉන්දියානු සාගරයේ ස්ථාපිත ඇමරිකානු යුද්ධ නාවික බලකායට අවිආයුධ ඇතුලු උපකරණ සැපයීමට ලංකාවේ ත්‍රිකුණාමල වරාය සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස රහසිගතව මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබේ. එහි පලමු උපකරණ තොගය පසුගිය දා බහරේන් සිට කටුනායක ගුවන් තොටට ගෙන එනු ලැබුවේ ඩොලර් මිලියන 25ක වෙළඳ භාණ්ඩ ගිවිසුමක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ජනතාවගේ ඇසට වැලි ගසමිනි. මෙම භයානක මිලිටරි ගිවිසුම නිසා අනාගතයේදී රට දෙකට වී යාමේ අනතුරත් මෙයට යා වී තිබේ. මෙවැනි තත්වයකට මුහුණදිය හැක්කේ තුර්කියේ ජනාධිපති තයිප් එර්ඩෝගන් කලාපීය බලවතුන්ගේ එකමුතුවක් ගොඩනඟා ප්‍රබල නායකත්වයක් ලෙස කටයුතු කිරීමෙනි.

## යූ.ඇන්.පී. ආර්ථික ව්‍යසනය


ව්‍යසනකාරී නව ලිබරල්වාදී ආර්ථිකයට වඩාත් ලංවී ක්‍රියාත්මකවීමේදී සිදුවන්නේ කුඩු බීමට පුරුදුවූ අයෙකුට මත් කඩු නොමැතිව ජීවත් විය නොහැකි ආකාරයට ණය නොමැතිව රජය පවත්වා ගෙන යාමට නොහැකි වටපිටාවකි. රනිල් පසුගිය අවුරුදු 3 1/2 තිස්සේ ක්‍රියාත්මක කළ නවලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය නිසා රනිල්ටත් යූ.ඇන්.පි.යටත් දැන් මුහුණදීමට සිදු වී ඇත්තේ කුඩුකාරයාගේ ඉරනමටයි. අසීමිත ණය ගැනීමට අමතරව, රාජ්‍ය දේපොල හොරකම් කිරීම, ජාතික සම්පත් විකිණීම, විදේශික ආධිපත්‍යයට ඉඩ සැලසීම හා අවසානයේ ලාංකික ජාතික රාජ්‍ය දියකර හැරීම රනිල් හා යූ.ඇන්.පි.ය ක්‍රියාත්මක කරන අවසන් වැඩපිලිවෙලයි. මේ සඳහා තහනම් අවි, මත් ද්‍රව්‍ය පැතිරවීම, කලු ආර්ථිකය හා පාතාලය වර්ධනය මෙහි අංගෝපාංගයන්ය. යූ.ඇන්.පි.යේ අරමුණ වන්නේ සියලු ලාංකික ජනතාව අතරමං කර විදේශිකයින් බලවත් වූ ලාංකික ඉහල ධනපතියන් කිහිප දෙනෙකුගේ අයිතිවාසිකම් ආරක්ෂාවන ජාත්‍යන්තර කොම්පැණි රාජ්‍යයක් ගොඩ නැගීමය. මොවුන්ගේ ආදර්ශයන් වන්නේ කුඩා දූපත් රාජ්‍යයන් වූ සිංගප්පූරුව, ෆීජී, මාලදිවයින්, සොලමන් දූපත් ආදී ජනතාව යටත් කළ කොම්පැනි පාරාදීසයක් හැදීමය. හෙලයාගේ උරුමය තොරොම්බල් කරන නරුමයන් නව ලිබරල් මාවතේ රනිල් පිටුපස ඇදී යන්නේ ගිණිකන වැටුනු පළගැටියන් මෙනි. ජනාධිපති මෛත්‍රීපාල මත්ද්‍රව්‍ය උවදුරට විරුද්ධව සටන් ඇරඹීම යූ.ඇන්.පී. ව්‍යසනකාරී පියවරට අභියෝගයක් වනු නියතය.

## සීතල දෙසැම්බරයේ ප්‍රතිවිප්ලවය අවසන් නැත

රනිල් විදේශ තානාපති කාර්යාල සමඟ එක්ව සීතල දෙසැම්බරයේ දියත් කළ ප්‍රතිවිප්ලවය අවසන් නැත. එය එක් අතකින් ඔහුගේ බෙල්ලේ එතී සිරවෙන අතර, අනිත් අතින් යූ.ඇන්.පි.ය ආණ්ඩු බලය මෙහෙයවයි. එනිසා කල් ගතවන හැම මොහාතක් පාසාම ලාංකික රාජ්‍යයේ ගෙල සිර කරමින් ජනතාවගේ පනනල වනසමින් විදේශික ආධිපත්‍යකට රටත් ජනතාවටත් පාවාදීම යූ.ඇන්.පි.ය විසින් සිදු කරයි. මෛත්‍රී - මහින්ද එකමුතුවත්, විපක්ෂ නායකත්වය ඒකාබද්ධ විපක්ෂයට අත්පත් කර ගැනීමත්, සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නියෝජිතයින් ලෙස පෙනී සිටීමත් නිසා රනිල් සහ චන්ද්‍රිකා වෙත විදේශ තානාපති කාර්යාලවල පීඩනය තදින් එල්ල වෙමින් තිබේ. ශ්‍රී ල.නි.ප. මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් එක් කර ජාතික ආණ්ඩු අට්ටාලයක් ප්‍රකාශයට පත් කර අමාත්‍ය ධූර වැඩිකර ගැනීමට යූ.එන්.පි.ය තවත් උත්සාහයක් දරයි.

## මහා සන්ධානය පමා වෙන්නේ ඇයි?

ඒකාබද්ධ විපක්ෂය මහා සන්ධානයකින් ජනතාව පෙලගැස්වීම පමා කරමින් සිටින තරමට අතරමැද අවස්ථාවාදී ගොනුවීම් මතුවීම් ස්වභාවිකය. එය ලකුණ නිසා, නායකත්වය නිසා, දිස්ත්‍රික් ලැයිස්තුවල ඉඩකඩ මදි නිසා, හා පාවා දුන් අය සමඟ එක්වීමට නොහැකි නිසා යනුවෙන් විවිධ හේතු කාරනා සැපයුවත් එහි කොන ගැටගැසී ඇත්තේ 2020 තෙක් යූ.ඇන්.පි. ආණ්ඩුව ගෙනයාමට ඉඩදී බලාසිටීමය. මෙහිදී මහින්දගේ නායකත්වය සුරුවමක් ලෙස ජනතාවට පෙන්නා සිරිසේන එලවා තනිව බලය අල්ලා ගැනීමක් සිදු කළ හැකියැයි ජනතා කඳවුරේ ඇතැමුන් කෙටියෙන් කල්පනා කරන බව පෙනෙන්නට තිබේ. ප්‍රතිගාමී යූ.ඇන්.පී. කඳවුර පරාජය කිරීමට නම් වහාම මහින්ද-මෛත්‍රී නායකත්වයෙන් මහා සන්ධානය කැඳවීමට පියවර ගත යුතුව ඇත. දැනට පවතින වටපිටාව අනුව බලවත් පාර්ශවය වන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සභාපති ලෙස මෛත්‍රීපාල මහතා විසින්ම සියලු පාර්ශව කැඳවා පියවරක් ඉදිරියට තැබීමය. ඒ අනුව මහින්ද - සිරිසේනගේ නායකත්වයෙන් පළාත් පාලන නියෝජිත සමුළුව හා ජාතික කම්කරු සමුලුව කැඳවා ජාතික ආර්ථික වැඩපිලිවෙලක් එලිදැක්වීමත් සිදු කර මැතිවරණ සටන පටන් ගත හැකි වනු ඇත.




▪ සිරිසුමන විදානපතිරණ

# රටත් ජනතාවි

## පාර්ලිමේන්තුව දුර්වල කර මධ්‍යම රජය අඩපණ කරයි



විපක්ෂ නායක - මහින්ද රාජපක්ෂ

පසුගියදා පාර්ලිමේන්තුව ව්‍යවස්ථා සම්පාදක සභාව ඉදිරියේ ව්‍යවස්ථා කෙටුම්පතක් ලෙස සකස් කර තිබූ පිටු 187 ක වාර්තාවක් අගමැතිවරයා සභාගත කළා. ඉන් පසු ඔහු "ව්‍යවස්ථාවකුත් නැත. ව්‍යවස්ථා කෙටුම්පතකුත් නැත." කියමින් රට වටේ යනු අප දුටුවා. එවැන්නක් කියන අතරම අළුත් ව්‍යවස්ථාවක් යටතේ ලංකාව බෙදිය නොහැකි එක්සත් රටක් හැටියට පවතින බවත්, බුදු දහමට තිබුණු තැන වෙනස් නොවන බවත් අගමැති වරයාත්, එක්සත් ජාතික පක්ෂයේ වෙනත් මැති ඇමතිවරු ප්‍රකාශ කරනවා.

රටේ පවතින කෘෂිකාර්මික පලිබෝධ උවදුරත්, ණය උගුල වැනි අනේකවිධ අර්බුද මධ්‍යයේ නව ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කෙරෙන මේ හොරගල් ඇල්ලීම අප කවුරුත් අනුමත කරන්නේ නැත.

පාර්ලිමේන්තුව දරුණු ලෙස දුර්වල කර පළාත් ව්‍යවස්ථාදායකයක් විශාල වශයෙන් බලවත් කිරීමට අළුත් ව්‍යවස්ථා කෙටුම්පත යෝජනා කර තිබෙනවා. පළාත් සභාවක් හෝ එම නීතියට විරුද්ධ වුවහොත් එය සම්මත කිරීමට පාර්ලිමේන්තුවේ 2/3 ක බලයක් මෙන්ම ජනමත විචාරණයක් අවශ්‍ය වෙනවා. නමුත් ඒ ආකාරයට සම්මත කරන නීතියක් වුවත්, පළාත් සභාවට සරළ බහුතරයකින් සම්මත කරන පනතකින් අහෝසි කරන්නට හැකිය. (කෙටු. 132 ඡේදය) පාර්ලිමේන්තුවේ බලය ඒ ආකාරයට සීමා කළ විට ඒකීය රාජ්‍යය ෆෙඩරල් රාජ්‍යයක් බවට පත්වෙනවා. අපි ඒකට සම්පූර්ණයෙන් විරුද්ධයි.

සමගාමී ලැයිස්තු විෂයන් ගැන පාර්ලිමේන්තුවේ නීති සෑදීමට නම් සියළු පළාත් සභාවල එකඟත්වය ගත යුතුයි. (134 ඡේදය) ඒ අනුව එවන් එකඟතාවයක් ලබා ගන්නවාද නැද්ද තීරණය කිරීමට වත්මන් ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට බලය අහිමි වෙනවා. ඒ වගේම ව්‍යවස්ථාවෙන් පිහිටුවීමට යෝජනා කරන ව්‍යවස්ථාමය කාරණා උසාවිය විසින් එකී නීතිය අවලංගු කළ හැකියි. (182 (ඈ), 185 ඡෙදා) ඒ අනුව පාර්ලිමේන්තු බලය තවත් හීන වෙනවා. ඒ වගේම මධ්‍යම ආණ්ඩුවේ බලතල සම්බන්ධව සමගාමී ලැයිස්තු ද නැත්නම් වෙනස් ඒවාද යන්න පිළිබඳව සඳහනක් එහි නැත.

ජාතික පොලිස් සේවය සහ පළාත්බද පොලිස් සේවාවන් 09 ක් ලෙස සකස් කොට ඇත. ඒවී 09 ට වෙන වෙනම පොලිස් කොමිෂන් සභා පත් කිරීමට විධි විධාන සකස් කර ඇත. එසේම ජාතික පොලිස් සේවයට අයිති වන්නේ රාජ්‍ය විරෝධී කටයුතු, මැතිවරණ සම්බන්ධ කාරණා, හොර මුදල් අච්චු ගැසීම වැනි කරුණු කීපයක් පමණි. අනෙක් සියළුම එදිනෙදා පොලිස් කටයුතු එනම් අපරාධ, මත්ද්‍රව්‍ය, රථවාහන, මහජන සාමය අයිතිවන්නේ පළාත්බද පොලීසි වලටය. මේ අනුව බලන කල රට කැබලි කළ හැකිවේ. 13 වෙනි සංශෝධනයේ කුමක් තිබුණත් කිසිම රජයක් විසින් පොලිස් සේවය සඳහා මෙසේ තීන්දු නොගත් බව සඳහන් කරමි.

අළුත් ව්‍යවස්ථා යෝජනා වලට අනුව මධ්‍යම ආණ්ඩුවෙන් හදිසි නීතිය ප්‍රකාශ කළත් එයට විරුද්ධව අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කර වාරණයක් ලබාගත හැකිය. හදිසි නීතිය ප්‍රකාශ කිරීම යනු විධායකයේ ක්‍රියාවකි. එවන් කාරණා සම්බන්ධව අධිකරණයට කටයුතු කිරීමට නොහැකිය. හදිසි නීතියට වාරණයක් ගතහැකි නම් එය ප්‍රකාශ කිරීමෙන් ඵලක් ද නැත. එමෙන්ම බෙදුම්වාදයට එරෙහි විශේෂ ප්‍රතිඥා අළුත් ව්‍යවස්ථා කෙටුම්පතේ පෙනෙන්නට ද නැත.

අද රට පාලනය කරන එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, දෙමළ ජාතික සන්ධානය ඇතුළු හවුල නීති සම්පාදනය කිරීමේදී දක්වා ඇති වංචාසහගත ප්‍රවේශය නිසා ආණ්ඩුව කෙරෙහි ජනතා විශ්වාසය බරපතල ලෙස බිඳී හමාරය. මේ ආණ්ඩුවේ කපටිකම්වල සීමාවක් ද නැත. වශේෂයෙන් මහා සංඝරත්නය මේ උප්පරවැට්ටි ගැන අවබෝධයෙන් සිටිය යුතු යැයි මා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ඊළඟ ජාතික මැතිවරණයේ දී ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධව අපේ යෝජනා ඉදිරිපත් කරමින් ඒ වෙනුවෙන් ජනතා වරම් ලබා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

## එජාප ආණ්ඩුව දොන් ජුවන් පාලනයක්



පාර්ලිමේන්තු මන්ත්‍රී - උදය ගම්මන්පිල

අද අපේ රටේ තිබෙන ලොකුම ව්‍යයසනය තමයි බටහිර අධිරාජ්‍යවාදීන්ගේ රූකඩයක් මේ රට පාලනය කිරීමයි. මීට පෙර අපේ රටේ මේ තත්වය දුටුවේ 16 වන සියවසේ දොන් ජුවන් ධර්මපාල රාජ්‍ය සමයේදීය. එදා පෘතුගාලයට අවශ්‍ය ලෙස කෝට්ටේ රජකම් කළ දොන් ජුවන් ධර්මපාල විසින් රූකඩයක් සේ කටයුතු කරමින් කෝට්ටේ රාජධානියම පෘතුගාලයට පාවා දුන්නා. නමුත් වාසනාවකට සීතාවක රාජසිංහ හා විමලධර්මසූරිය වීර රජවරුන් නිසා පෘතුගීසීන්ට රටේ අනෙකුත් රාජධානි හා ප්‍රස්තුතයන්ට නතු කරන්න ඉඩක් ලැබුණේ නැත. වර්ථමාන දොන් ජුවන් ධර්මපාල ලෙස සළකන රනිල් වික්‍රමසිංහ තමන්ට ආවේණික ලෙස රට තුළම බටහිර න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඒ වගේම මේ රට කැබලි කර දේශසීමාවන්ට වෙන් කොට ඇනකොටා ගන්නා ජාතිකයක් රටක් බවට පත් කරන්නට කටයුතු කරමින් සිටිනවා.

ඒ වගේම අපේ රටේ ආර්ථික මර්මස්ථාන චීනය ඉන්දියාව වැනි නැගීඑමින් පවතින රටවල් වලට දෙමින් සිටිනවා. ඇමරිකාව ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය ලෙස කටයුතු මෙහෙයවමින් සිටිනවා. රණවිරුවන්, භික්ෂූන් වහන්සේලා, වැඩකරන ජනතාව ප්‍රබල මර්ධදනයකට හසුකර තිබෙනවා. මේ සියළු මර්ධනකාරී පියවරේ සිටින්නේ එක්සත් ජාතික පක්ෂයත් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාය. ඒ නිසා අද අපට කෙටි කාලීන හා දිගු කාලීන ඉලක්ක වලට යෑමට සිදුවී තිබෙනවා. කෙටිකාලීන ඉලක්කය වන්නේ 20 වෙනි ව්‍යවස්ථා සංශෝධනය හරහා ජනතා විමුක්ති පෙරමුණ ගෙනෙන්නාවූ ව්‍යවස්ථා වෑයම පරාජය කිරීමයි. දිගුකාලීන ඉලක්කය වන්නේ 2019 ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ කල්ලිය පරාජය කිරීමයි.

කෙසේ නමුත් පසුගිය පළාත් පාලන මැතිවරණයේදී පොදුජන පෙරමුණ ඡන්ද ලක්ෂ 42 කුත්, එක්සත් ජාතික පක්ෂය ඡන්ද ලක්ෂ 30 කුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්ද ලක්ෂ 12 කුත්, ජනතා විමුක්ති පෙරමුණ හා දෙමළ ජාතික සන්ධානය ලක්ෂ 6 බැගිනුත් ඡන්ද ලබාගනු ලැබුවා. එය පුංචි ඡන්දයක් වුනත් සාමාන්‍ය ජනාධිපතිවරණයකට පවතින ඡන්ද ප්‍රතිශතයක් ලැබූ බව සඳහන් කරන්නට අවශ්‍යයි. ඒ අනුව 81% ක් ඡන්ද දායකයෝ ඡන්දය දී තිබෙනවා.

එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, දෙමළ ජාතික සන්ධානය එකතුව මේ මැතිවරණයට ඉදිරිපත් වුවත් ඡන්දය දීමේ ප්‍රතිශතය අනුව, අපට ජනාධිපතිවරණය දිනාගත හැකිය. එය රටේ හා පොදුජන පැතුමයි. මන්ද යත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අප සමග සන්ධානගතව සිටින නිසා හා ඔවුන්ගේ මතවාදයත් අපේ මතවාදයට යම් සමානාත්මතාවයක් පවතින නිසා පොදුජන පෙරමුණට අවැසි ඉතුරු ලක්ෂ 8 ලැබෙන බව නොරහසකි.

දැන් අපට සමහර උදවිය ජාතිවාදී යැයි පවසනවා. ඔවුන්ගෙන් අහන්න තියෙන්නේ අප කළ ජාතිවාදී ක්‍රියාව කුමක්දැයි කියා. අපි අහිංසක දෙමළ, මුස්ලිම් ජාතීන්ට පීඩා කර තිබෙනවාද? මතක තබාගන්න මහින්ද රාජපක්ෂගේ වසර 10 ක යුගයේ බේරුවලදී සිදුවූ එකම ජාතිවාදී සිද්ධිය වන සිංහල මුස්ලිම් කෝලහාලය සිදුකළේ ද අපේ පාර්ශවයෙන් නොවන වග පැහැදිලි කරන්න කැමතියි. එම සිද්ධිය සිදුකළේ අද එක්සත් ජාතික පක්ෂයේ සිටින ප්‍රභල ඇමතිවරයෙකු විසිනි. එම නිසා එම විමර්ශනය පවා සඟවා තිබෙනවා.

නමුත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුල එවැනි සිදුවීම් වසර 03 කටත් අඩු කාලයකින් සිදුව තිබෙනවා. අම්පාර, ගාල්ල, මහනුවර, දිගන ඇතිවූ සිද්ධීන් නිසා මුළු රටම මහා අවුලකට පත්වූ බව සඳහන් කරමි. එක්සත් ජාතික පක්ෂයට එම සිද්ධිය හරහා සුළු ජාතීන් කිසිවෙකු ජාතිවාදීන් යැයි කියන්නේ ද නැත. පන්සල් ඩෝසර් කරන ලද බෝග ස් කපන ලද පිළිම කඩන අය සමඟ සංහිඳියාව බලාපොරොත්තු වන්නට බැහැ. දෙමළ ජාතික සන්ධානය සමග ජනතා විමුක්ති පෙරමුණ කරට අත දාගෙන ජාතිවාදීන් යැයි පවසන්නේ අපිටයි. අපි කළ එක ජාතිවාදී ක්‍රියාවක් පෙන්නන්නැයි මා ඔය අයට අභියෝග කරනවා.



## රාජ්‍ය ආරක්ෂාවත් දුර්වල කර ජනවාර්ගික ගැටුමකට සැරසීමක්



පාර්ලිමේන්තු මන්ත්‍රී - විමල් වීරවංශ

2015 දී රනිල් වික්‍රමසිංහ මහත්තයලා විසින් පූර්ණ සාමකාමී රටක් තමයි භාරගත්තේ. සෙසු ආගමික අනන්‍යතාවයන්ට ප්‍රහාරය එල්ල කරමින් ඒවාගේ ඇති ගෞරවණීය භාවය නොසිතමින් පිටරටවල ආයතනවලට සංවිධානවලට අවශ්‍ය ලෙස අධිරාජ්‍යවාදීන්ගේ න්‍යාය පත්‍ර වලට අනුකූලව යමින් කටයුතු කිරීම නිසා මේ සිදුවෙමින් යන ක්‍රියාදාමයන් අපේ රටේ ජනතාව දැණුවත් විය යුතුයි. විශේෂයෙන් මුස්ලිම් ජනතාව මේ ගැන අවධානය යොමු කළ යුතුයි.

පසුගිය දිනවල පුත්තලම් ප්‍රදේශයේ අවි ආයුධ විශාල ප්‍රමාණයක් හසුවුනා. එමෙන්ම වනාතවිල්ලුව ප්‍රදේශයේත් අවි ආයුධ විශාල ප්‍රමාණයක් අසුවුනා. එසේ හමු නොවුනු තැන් තවත් කොපමණ තිබෙනවාද?

කීරගල චෛතිහාසික නටඹුන් වල නැගී තරුණයන් 7 දෙනෙකු ඡායාරූප අරන් තිබෙනවා. ක්‍රි.පූ. 4, 5 කාල වකවානු වල නිර්මාණය කෙරුණු ඒ නටඹුන් අපේ ජාතික සම්පත්. එවැනි ජාතික සම්පත්වලට හා ආගමික සිද්ධස්ථානයකට ගරු නොකොට ඔවුන් මෙවැනි දේවල් කිරීමට පෙළඹුනේ කොහොමද කියල බලන්න වෙනවා. මේ රට ඕනෑතරම් ලේ ගලපු රටක්, ලේ දැකපු රටක්. තවත් එවැනි දේ කරන්න වත් ලේ හලන්න වල් මළ මිණී ගොඩග හන්න වත් අවශ්‍ය නැහැ. මෙතෙක්


# ...වත් අනාථයි




කාලයක් නොතිබුණු ත්‍රස්තවාදයක් ඇතිකරන්න අවශ්‍ය නැහැ.

දැං බලන්න ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දුගේ ප්‍රකාශය. ඔහු යුධ අපරාධ කළ රණවිරුවන් ඉන්නවද කියල විමසන්නේ දෙමළ ඩයස්පෝරාවෙන්. ඔවුන්ට ආරාධනා පත්‍ර යවල මේ ගැන විමසන්නේ. රටේ ඒකීය භාවයට මෙය කොතරම් බරපතල ප්‍රකාශයක් ද? මේ ප්‍රකාශය ජනාධිපතිතුමා පවා දන්නේ නෑ. ඔහු ආරක්ෂක ලේකම් ධූරයට තවදුරටත් සුදුස්සෙක් කියා මා සිතන්නේ නැත. රටේ ආරක්ෂාව තහවුරු කරනු වෙනුවට අපේ රටට වින කරන සංවිධානයක් පිළිගනිමින් රටේ පුරවැසියන්ට විරුද්ධව ජාත්‍යන්තරය සමග එකතුව එල්.ටී.ටී.ඊ. ව්‍යාපාරයේ ප්‍රතිඥාවන් ඉටු කිරීම ගැන මට ඇත්තේ මහත් පිළිකුලක්.

## පොදු ජන පෙරමුණ ඕනෑම ඡන්දයකදී දිනනවා



පාර්ලිමේන්තු මන්ත්‍රී - දිනේෂ් ගුණවර්ධන

ව්‍යවස්ථාවට මුවා වෙලා එක්සත් ජාතික පක්ෂය විසින් ආණ්ඩුව විසුරුවන්න බැහැයි කියලා රජයක් පත්කරගෙන ව්‍යවස්ථාවට පටහැනිව දැන් කටයුතු කරනවා. ඇමතිකම් අසීමිත ලෙස ගන්නට පොරකනවා. රනිල් වික්‍රමසිංහ ඇතුළු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දැන් හෝදාපාළුවට යමින් තිබෙන්නේ. ඒ නිසා ඒ අයගේ මන්ත්‍රීවරු සතුටු කරන්න කටයුතු කිරීම සඳහා ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරන්නට මාන බලනවා.

පසුගිය කාල වකවානු වලදී සමහරු කිව්වා දින 51 න් පසුව පොදුජන පෙරමුණේ ජනප්‍රිය බව අඩුවෙලා කියලා. නමුත් එහෙම ජනප්‍රිය කම අඩු නම් අපි මැතිවරණ ඉල්ලනවාද? අපට එහෙම ජනප්‍රිය කමේ අඩුවක් වෙලා නැහැ. ඊකට හේතුව එක්සත් ජාතික පක්ෂයට අවුරුදු 4 ක් යන තුරුත් මේ රටේ ප්‍රශ්න විසඳන්න බැරිවෙලා තිබෙනවා. ආහාර, නිවාස, සෞඛ්‍ය වගේම රටේ පිරිහීයෑම, රටේ පැවැත්ම ආරක්ෂා කරගන්නට ඔවුන්ට බැරිවෙලා තිබෙනවා. අළුත් පරම්පරාවට ක්‍රමෝපායන් සහිත ආර්ථිකයක්, අධ්‍යාපනයක් ලබාදීමට බැරි වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ රජය 2.7 ක සංවර්ධන වේගයෙන් පහතට බැහැල තිබෙනවා. බොරු ආටෝපශීලී රජයක මුහුණුවර හැර සංවර්ධනයක් නැති, දියුණුවක් නැති ණය වුණු රටක් බිහිකරල තියෙනවා. තෑගි දෙනවා, සහතික දෙනවා, මහා ලොකු උත්සව තියනවා ඒ සියල්ල ආටෝප පමණයි. උතුරු නැගෙනහිරට වත් ඔවුන් කථාකරන පරිදිම පහසුකම් සකස් කර දීල නැහැ. කොහොම වුනත් ව්‍යවස්ථා සංශෝධනයක් ඇවිත් තියෙනවා. ඔවුන් කොතනකවත් මහජනතාවගෙන් නොවිමසා කෑලි එල්ලලා සමහර ඒවා ගලවලා අළුත් එකකින් ලියලා ඉදිරිපත් කරල තියෙනවා. මේක ලියන්නේ සුමන්තිරන්ලාට අදාළ විදිහට ඔවුන්ගෙ කණ්ඩායමට අදාළ විදිහට. එහෙම නැතිව රටේ අනාගතයට සුභසිද්ධියට නොවෙයි. එල්.ටී.ටී.ඊ. ඒකට අදාළව ව්‍යවස්ථා සංශෝධනයක් රටට ගේනවට අපි විරුද්ධයි.

මෙවැනි ව්‍යවස්ථා සංශෝධනයන්ට මුවාවෙලා පසුගිය කාලය පුරාම කථානායකවරයා ක්‍රියා කළා. විපක්ෂ නායකයා තෝරාගන්න අවස්ථාවේත් කථානායකතුමා විසින් අධිකරණයේ පිහිට පැතීමට යෑමට පවා ප්‍රකාශය නිකුත් කළා. නමුත් විපක්ෂ නායක පත් කිරීමේ බලය තිබෙන්නේ කථානායකට. පාර්ලිමේන්තුව තුළ ඔහු රජයට පක්ෂපාතීත්වය පෙන්වමින් මුළු පාර්ලිමේන්තුවම හෑල්ලුවට ලක් කළා. හඬ අනුව තීන්දු ගත්තා. ඔහු මේ ක්‍රියාවේ යෙදුනේ අද ඊයෙක නොවෙයි. විමල් වීරවංශ මන්ත්‍රීතුමා ස්වාධීන වන්න ඉල්ලූ මොහොතේ එයට එකඟව පසුව එකී තීරණය වෙනස් කළා. විටෙක මා පාර්ලිමේන්තු සභා ගැබෙන් එලියට දැම්මා. ඒ දැම්මේ ඊට වඩා දරුණු අවස්ථා වලදී එක්සත් ජාතික පක්ෂයේම උදවිය වැරදි කරන අවස්ථාවේත් එලියට නොදා සිටීමුයි. ඒ නිසා මේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ගෙනයන අණ පනත් පිළිබඳ අප විශේෂයෙන් සැළකිලිමත් විය යුතු වෙනවා කථානායක වරයාගේ ක්‍රියා කලාපයන් නිසා.

ශ්‍රේෂ්ඨාධිකරණයට මුවාවෙලා ඡන්දයක් තබන්නට බැරි ලෙස තීන්දුවක් ගෙන නැවත වරක් ආණ්ඩුවක් එක්සත් ජාතික පක්ෂය විසින් හදාගත්තා. විෂය පථය කාර්යභාරයන් නිසියාකාරව නැතිව ඇමතිවරු පත්කරලා කටයුතු කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව ඔවුන්ගේ කටයුතු සිදුවෙනවා. අපට අවශ්‍ය වන්නේ පළාත් සභා, ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ අපි ඒ හැම එකකම සූදානම්. අද රටට විදේශ විනිමයක් නෑ. අපේ ආර්ථිකය බිඳවැටිලා. රටේ නිෂ්පාදන බිඳවැටිලා. රට අස්ථාවරයි.

ආසියාවේ දියුණු රටක් කරන්නත්, රටේ පුරවැසියා වීමේ ආඩම්බරය අපේ ජනතාවට ලබාදිය යුතුයි. මේ සුන්දර වටිනා දිවයින විදේශිකයින්ට ඇඟිලි ගහන්න දෙන්න බෑ. දේශපාලන වාසි නොතකා ගැඹුරින් රට ගැන හිතන දේශපාලනඥයින්ගෙන් සපිරි රටක් ජනතාවාදී ආණ්ඩුවකින් බිහිකරමු.

## පළාත් සභා ඡන්දය තවත් කල්දැම්මොත් මහා සටනක් අරඹනවා



පාර්ලිමේන්තු මන්ත්‍රී - වාසුදේව නානායක්කාර

මේ ආණ්ඩුවට ජනමත වරමක් නෑ. මේ ආණ්ඩුවට තිබුණු ජන වරම 2018 වසරේ පෙබරවාරි 10 වෙනිදායින් පසු පළාත් පාලන මැතිවරණයත් සමග අහිමි වුණා. ඒ වගේම ආණ්ඩුව විසුරුවා පාර්ලිමේන්තු මැතිවරණයකට යෑමට තිබූ අවස්ථාව අධිකරණය ඔස්සේ නීතියට මුවා වෙලා උපක්‍රමශීලීව මේ ආණ්ඩුව විසින් මහජන මතය ද යටපත් කළා.

අද පවතින්නේ ජන වරමක් නොමැතිව පාර්ලිමේන්තුවේ ද 2/3 බලයක් නොමැති ආණ්ඩුවක්ය. මේ නිසා මේ ආණ්ඩුවට දෙමළ ජාතික සන්ධානය මත යැපීමට සිදුවෙලා තිබෙනවා. එතකොට දෙමළ ජාතික සන්ධානය යම් යම් එකඟතාවයන් වලට එක්සත් ජාතික පක්ෂ රජයට යටත් වෙන්නත් සිදුවෙනවා. එහෙම බැලූ කල මේ රජය අති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් නොවෙයි.


පසුගිය කාලයේ අපි ඒකාබද්ධ විපක්ෂය ලෙස කටයුතු කිරීමේදී එක්සත් ජාතික පක්ෂයත්, දෙමළ ජාතික සන්ධානයත් එකට වැඩ කළා. නමුත් අද දෙමළ ජාතික සන්ධානයේ ඊට වඩා ඔවුන්ගේ නීති රීති වලට යටත්ව අභිප්‍රායන් ඉටු කිරීමට මේ රජය බැඳී සිටිනවා. එය එක්සත් ජාතික පක්ෂ රජය ඇතුලෙත් යම් අර්බුධයකට, බෙදීමකට හසුවී තිබෙනවා. එය ඇමතිකම් නොලැබී යාම තරම් තවදුරටත් වර්ධනය වෙමින් තීව්‍ර වී තිබෙනවා.

ඉතින් මේ කාරණා සළකා බැලුවාම පේන්න තිබෙන්නේ මේ ආණ්ඩුව දෙමළ ජාතික සන්ධානයේ කොක්කේ එල්ලිලා තියෙන ආණ්ඩුවක් ලෙසයි. අපි මේ වෙලාවේ ආසන්නම මැතිවරණ වලට සූදානම් වී ජන වරම ලබා ගැනීමේ කාර්යයේ නියැලී ඉන්නවා. දැන් ජනාධිපතිවරණය අපේ පාර්ශවයේ සිටින පක්ෂ 10 ක් පමණ මත විමසීම් කරලා ජනාධිපති අපේක්ෂකයා කවුදැයි අවසාන තීන්දුව ගන්න මහින්ද මහතාට පවරනවා. රට බේරා ගැනීමේ ජන වරම දිනාගන්නා පොදු අපේක්ෂකයා ඉදිරිපත් කරන්නේ අපියි.

මේ සියළු කාරණා අතර එක්සත් ජාතික පක්ෂ රජයේ පුරෝකථනයට අනුව ඉඩම් මංකොල්ල සිදුවෙමින් පවතිනවා. රජයට අර්ධ රාජ්‍යයට අයිති ඉඩම් බැංකුවකට පවරා විදේශිකයින්ට මේ රටේ ධනවතුන්ට බෙදා දීමට වැඩ කටයුතු සකස් කරනවා. එයින් අදහස් කෙරෙන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාව එම ඉඩම් අයිතිය භුක්ති විඳීම වැළැක්වීමයි. එයින් ගොවියන්ට, දුප්පතුන්ට, සාමාන්‍ය ජනතාවට එම අයිතිය නොලැබී යනවා. මහා පරිමාණයේ ඉඩම් කට්ටි කොට විකිණීම ඉදිරියේදී දකින්න ලැබෙනවා. එයින් විශාල ලෙස ඉඩම් හිඟයක් රටේ දකින්නට ලැබේවි.

අද කෘෂිකර්මාන්තයටත් මේ රජයේ නොසැළකිලිමත් කම නිසා අගාධයකට පත්වෙලා තිබෙනවා. ඒ වගේම කෘෂිකර්මයේ ඵලදායිතාවය වගේම සමස්ථ වටිනාකම අඩුවෙලා තිබෙනවා. එයටම නියඟය ජල ගැල්ම ආදිය බලපෑවා. මේ සියල්ලටම වඩා ආණ්ඩුව මැදිහත් වෙලා බීජ ගෙන්වීම හා සැපයීම ආදියෙන් තොර වීම නිසා කෘෂිකර්මය බිඳවැටීලා. මහින්ද මහතා දුන් පොහොර සහනාධාර පවා ගොවීන්ට භුක්ති විඳීමට නොහැකි වුනා. කෙසේ වෙතත් මේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන්නේ රටේ කෘෂිකර්මාන්ත නිෂ්පාදනය බිඳවැටෙන්න ඉඩ දීලා ප්‍රමිතියෙන් තොර කෘෂි නිෂ්පාදන රට තුළට ගෙන්වා ගැනීමයි. දැන් මිනිස්සු පාන් පිටි පරිභෝජනය දෙගුණයකින් වැඩි කරලා. එය සෞඛ්‍යයටත් අහිතකරයි. කුරහන් පවා මේ රටට දැන් ගෙන්වනවා. බඩ ඉරිඟු වලින් රට ස්වයංපෝෂිත වෙලා තිබුණේ. දළඹුවා එන්න කලින් පවා මේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බඩඉරිඟු වලට සහතික මිල, පොහොර බීජ යන පහසුකම් නොදීම නිසා එම වගාව හානි වෙමිනුයි තිබුණේ. මේ රටේ ස්වයංපෝෂිත තත්වය පිටරට්ටින් අතපෙවීම නිසා විනා කෙරිලා තියෙන්නේ. එම නිසා මහජනතාවගේ ජනවාදී ආණ්ඩුවකින් අපට කෘෂිකර්මාන්තයත් රටත් බේරාගත හැකි වෙනවා.

සාකච්ඡා කලේ
ජනබන්දු සේනානායක



# බලන් කඩ තුරා හැර දැසේ

**විකිරි දිසානායක**

මා දෙසැම්බර් 31 දා උදේ කොළඹ බලායෑමට ගාලුපාරට පිවිසුනේ කන්දේ විහාර හන්දියටය. එවිට මගේ නෙත ගැටුණේ හන්දියේ සවිකර තිබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගේ වර්ණවත් රූපකාය සහිත වැඳ නමස්කාර පූර්ව දැවැන්ත කටවුට් කෙරෙහිය. එවාහි සඳහන් කර තිබුණේ උදාවූ 2019 නව වසර ,රටටත් ජනතාවටත් යස ඉසුරින් පිරි සෞභාග්‍යමත් නව වසරක් වේවා, යනුවෙන් වූ ආශිර්වාද පාඨයන්ය. ගෙවුණු 2018 වර්ෂය උදාවූ දිනත්, මොවුන්ගේම මෙවැනි සුභාශිංශන සහිත දැවැන්ත කටවුට් මෙකී මංසන්ධියේ අටවා තිබුණි. 2018 ද නිමාවිය. ආසිරි ප්‍රාර්ථනා එලනොදී සුළඟේ පාවී හමාරවිය.

බේරුවල, පයාගල, කටුකුරුන්ද, වස්කඩුව, වාද්දුව, පානදුර, මොරටුව, රත්මලාන, ගල්කිස්ස, දෙහිවල දක්වා නගර පසුකරද්දී මෙරට දේශපාලන සැදැහැවතුන්ගේ නව අවුරුදු කටවුට් ප්‍රමාණය ගණන් නොහැකි තරම් විය. පිටකොටුවට පැමිණිවිට සියලු ජාතික පුවත්පත් වලින්ද, රටේ ජන නායකයන් ජනතාවට සෞභාග්‍යයෙන් පිරි නව වසරට ආසිරිපතා තිබුණි.

මාගේ සොම්නස දෝර ගලන්නට විය. අඩුපාඩුවකට තිබුණේ ගිය වසරේ මෙන්ම මේ වසරේද යන කොටස පමණි. පසුව මුල්ලේරියාව දක්වා ගමන් යන අතරතුර පාන් කෑල්ලක්ල බත් කටක්, ළමයට කිරි පැකට් එකක් ගන්න, ෆාමසියෙන් බෙහෙත් ටිකක් ගන්න, සැමියාගේ ඔපරේෂන් එක කරගන්න අතපාන අසරණයන් 12දෙනෙකු මගේ නෙත ගැටුණි. ගුණසිංහපුර මංසන්ධියේ අලුත් අවුරුද්ද වැලඳීමට ඉල්ලුම්කරුවන් හමුවනතුරු ඔබමොබ සැරිසරන කාන්තාවන් මම දුටුවෙමි. කෙසෙල් වත්තේ කඩපිල් කීපයක වැතිරී නිදන යාචකයින්ද, මත් රකුසාට බිලිවූ තරුණයන් කිහිපදෙනකු අයාලේ පාවෙමින් සිටිනුද දක්නට ලැබුණි. 2018 වසරේ දින කිහිපයක් මුරුංගා කොළ තම්බා කා කුසගිනි නිවාගත් පවුලක පුවතක් උතුරුමැද පලාතෙන් වාර්තා විය. එම පලාතේම කුසගින්නට ඉදුණු කොවක්කා ගෙඩි කා පාසල් සිසුවකු මියගිය පුවතක්ද පලවිය. හම්බන්තොට, ඌව, උතුරුමැද, පලාත්වල ගොවි ජනයා සමහරෙක් මඤ්ඤොක්කා, වට්ටක්කා තම්බා කා වේල් ගණන් ගතකරන බවට ගවේෂණ වාර්තා මා සතුව ඇත.

පරිසර හිතී දමා හේන් ගොවීන් ගොවිබිම් වලින් පන්නා දමා, කවුපි, කුරහන්, මුංඇට, බඩඉරිඟු, කොල්ලු, පිටරටින් ආනයනය කරයි. 2017 වාර්ෂික මූල්‍ය වාර්තාවන්ට අනුව එම වසරේ කුරක්කන් පමණක් ආනයනය කිරීමට ඩොලර්




> **කොළඹ සුපිරි හෝටල් බහුතරයකම පාහේ දෙසැම්බර් 31දා රාත්‍රි තර්ටිෆස්ට් නයිට් සැමරුම අති උත්කර්ෂවත් ලෙස සංවිධානය කොට තිබුණි. රාත්‍රි 8.30 පමණ වන විට මෙකී නැටුම් සම්භාෂණයන් ඇරඹුණි. රැය පහන් වන තුරුම රැගුම්, වැයුම් දිගුවිය. ධනවතුන් හා පිරිවර සමඟ අනෙක විධ විලාසිතාවන්ගෙන් සැරසී සුබෝපභෝගී නවීන යාන වාහන වලින් සුපිරි තරු හෝටල් කරා සම්ප්‍රාප්තවනු දක්නට ලැබුණි.**

දසලක්ෂයක් වැයකර තිබේ. 1818 දී මෙරට හේන් ගොවිතේ ප්‍රධාන භෝග වගාවක් වූයේ කුරක්කන්, මෙනේරි, තනහාල්, ධාන්‍ය වගාවන්ය. 1818 බ්‍රිතාන්‍යයන් ඌව වෙල්ලස්ස ගිනිබත් කලේ මෙකී සෞභාග්‍යය වැනසීමටය. මේ වන විට බහුජාතික සමාගම් වලට හා දේශීය ජාවාරම්කාරයින්ට මෙකී ගොවිබිම පවරාදීමට ආණ්ඩුව පිඹුරුපත් සකසමින් සිටී. මෙකී ගොවිබිම මැනීම සඳහා ඇමරිකාව ඩොලර් මිලියන 500ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ලබාදුන්නේ මේ නෝබෝදාය. රටේ ජාතික ආදායමින් 80% ක් 20% ජන කොටසක් අතරත් ඉතිරි 20% මෙරට බහුතර රටවැසියා අතරත් බෙදීයන ප්‍රජාතන්ත්‍රවාදයක් අපට උරුමකර දුන්නෝ කවරහුද? රටේ ණයබර කෝටි 14 ලක්ෂය ඉක්මවා තිබේ. එක් පුරවැසියකු ලක්ෂ 05ක් ණය බරකට වන්දි ගෙවිය යුතු වින්දිතයන් බවට පත්කලේ කවුරුන්ද? ජීවන වියදම් දැරිය නොහැකි ජනතාවගේ උරමත හිතිපතා අසීමිත බදුබර පටවමින් ක්‍රියාකරන පාලකයින්ගේ සුභපැතුම් මරණ වරෙන්තු මිස සුභාශිංශන වන්නේ කෙසේද? ඉහත කී සමාජ යථාර්ථය අභියස 31දා නව අවුරුදු උදාවන රාත්‍රියේ මට විකල්ප පුවත්පතක ගවේෂණාත්මක ලේඛකයකු සමඟ 31 දා රාත්‍රියේ කොළඹ සුපිරි හෝටල් ජාලයේ සුපිරි කෙලිමඩලේ තොරතුරු වාර්තා කිරීම සඳහා අප දෙදෙනා ඔහුගේ යතුරු පැදියෙන් රාත්‍රි 8ට පමණ ගාලු මුවදොරට පැමිණියෙමු. කොළඹ සුපිරි හෝටල් බහුතරයකම පාහේ දෙසැම්බර් 31දා රාත්‍රි තර්ටිෆස්ට් නයිට් සැමරුම අති උත්කර්ෂවත් ලෙස සංවිධානය කොට තිබුණි. රාත්‍රි 8.30 පමණ වන විට මෙකී නැටුම් සම්භාෂණයන් ඇරඹුණි. රැය පහන් වන තුරුම රැගුම් වැයුම් දිගුවිය. ධනවතුන් හා පිරිවර සමඟ අනෙක විධ විලාසිතාවන්ගෙන් සැරසී සුබෝපභෝගී නවීන යාන වාහන වලින් සුපිරි තරු හෝටල් කරා සම්ප්‍රාප්තවනු දක්නට ලැබුණි.

මේ අතර රටට ජනතාවට සුභපැතුම් පලකොට තිබූ නායකයින්ද, කොම්පැනිකාරයින්ද, ධනවතුන්ද සිටියහ. සුපිරි ෂැන්ග්‍රිලා හෝටලයේ තර්ටිෆස්ට් නයිට් කෙලිමඩලට එක්වීම සඳහා ධනවතුන් මාස දෙකකට පෙර සිටම ටිකට්පත් මිලදී ගෙන ඇත. ටිකට් පත් අලෙවිය කොතරම් ඉහල ගොස් තිබුණේදයත් කොටසකට ඉදගැනීම සඳහා අසුනක් පවා අහිමි වී තිබිණ. එහි එලිමහන් පිට්ටනියේ පවා සැදු කුටි ඉදිකර තිබුණි.

> **රටේ ආදායමෙන් 20%ක් මුළු ජනගහනයෙන් 80% අතරේත් ආදායමෙන් 80% ජනගහන්යෙන් 20% අතරෙත් බෙදෙන අරුම පුදුම රටක් මේක**

මෙම හෝටලයේ ආහාර හා බීම සඳහා පැකේජ් හතරක් හඳුන්වා දී තිබුණි. ඩයමන්ඩ් පර්ල් රූබි සහ නව වසරේ සැදෑව ලෙස නම්කර තිබුණි. ඩයමන්ඩ් පැකේජය දසදෙනෙකුගෙන් යුතු කාණ්ඩායම් සඳහා මෙකී පැකේජය මිල ලක්ෂ 2කි.

සේද මාවතේ නව ලිබරල් වසංගතය දේශිය ජනයා සිප වැලඳගන්නා අසිරිය දුටුවිට මෙරටට උරුම අනාගතය ශෝකාන්තයක් නොවන්නේද? විවිධ පැකේජයන් සඳහා අය කිරීමේ එක් අයෙකුට රුපියල් 10,000 සිට 15,000 දක්වා විහිදුනි සෑම සුපිරි හෝටලයකට කොළඹ නගරයේ සුපිරි රටබීම අවන්හලක 31දා අලෙවිය බ්‍රැන්ඩි බෝතලය රු 90,000කටද ෂැම්පේන් බෝතලය රු 16,000ල 18,000ල 47,800 වැනි මිලගණන් වලට අලෙවි වී බීම සියල්ලද විකිණී අවසන්ව ඇත. මේවා මිලදීගත් බහුතරය ශ්‍රීලංකිකයන් වීම කාටද ආඩම්බර මෙරට බහුතර ජනයා ඉහත කී බඩජාරී සමාජ ආර්ථිකයක ගොදුරු බවට පත්වෙමින් දරිද්‍රතාවයෙන් පෙලෙමින් සිටියදී පාලකයින් හා ධනපති පැලැන්තිය නව ලිබරල් මූල්‍ය ආර්ථිකය ඔස්සේ අවුරුද්දේ එක්දිනකදී ලක්ෂ ගණන් මෙසේ ධනය වැයකර ලැබීම ලංකේය දියුණුවේ දර්ශණයද? ගෝල්ෆේස් පිට්ටනියට රොක්වෙන පොදු ජනයාටද මේ වසර අග අසිරියේ සතුට බෙදාදෙන සමාගම් ගිනිකෙළි දර්ශන පවත්වතිග ඔවුන් නටමින් ගයති. අසිරිය විදිති. නමුත් ඔවුන්ට වැය කලහැක්කේ එක් අයෙකුට ප්‍රවාහන වියදමත් සමඟ රුපියල් 50කි. සමහරුන්ට එහෙමත් නැත.

නමුත් ඔහුන් සුපිරි හෝටල් මාලිගා වලද මොහුන් පිට්ටනියේ සිට අසිරිය විඳිති. තමන් කරන මෙහෙවර නිසා උපදින ලාභ ගොඩ ගොඩවල් කොම්පැනි අයිතිකාරයන්ගේ බැංකු ගිණුම් වලටත්, සමහර ලාභ කොටස් කළු සල්ලි ලෙසත් මොහුන් අතට පත්වන අයුර දකිමින් හෝ නොදකිමින් අසිරිය විදිති. දුප්පත්, පොහොසත් පරතරය දැකගැනීමට පොදු ජනයාට හෝටල් ඇතුලේ නටන සම්භාෂණ පෙනෙන්නේ නැත.

# වක්‍ර බදු ගිණිමැලයේ ජනතාව පිලිස්සෙයි

එජාප ආණ්ඩුවේ බදු හා මූල්‍ය ප්‍රතිපත්තියේ බර පොදු ජනතාවට දරා ගැනීමට සිදුවීම නිසාද? සීඝ්‍ර ලෙස රුපියල බාල්දුවීම හේතුවෙන් වැටුප් වල මූර්ත අගය අඩුවී වැටුප් වේගයෙන් වාෂ්පවී යන නිසාද. නැගී එන ජනතා විරෝධයට සැබෑ විකල්පය ලෙස නායකත්වය දියයුතු බව ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති ඩඩ්ලි කලංසූරිය ප්‍රකාශ කලේය.



2019 වර්ෂය සඳහා මාර්තු මස ඉදිරිපත් කිරීමට නියමිත අයවැය මඟින් කම්කරුවකුගේ අවම වැටුප රු. 2500/- කින් සහ වෛද්‍ය හා පරිපාලන නිළධාරී අවම වැටුප් රු. 5000/- කින් පමණද වැඩ නිමකිරීමට ආණ්ඩුව බලාපොරොත්තු වන බවත් ඒ අනුව කම්කරුවකුගේ අවම වැටුප රු. 21746/- ක ප්‍රමාණයක් වන බවත්, ප්‍රකාශකර ඇතත්. පොදු ජනතාව අද මුහුණදෙන ජීවන වියදම් අර්බුදයෙන් ගොඩවීමට නම් අවම වැටුප රු. 50,000/- ක් වත් විය යුතු බව වෘත්තීය සමිති නායකයෝ ප්‍රකාශ කරති.

ජනාධිපතිවරණය හා ව්‍යවස්ථා කථා මඟින් ජනතාවගේ සැබෑ ප්‍රශ්න අමතක කර ඔවුන්ගේ අවධානය වෙනතකට යොමු කරමින් දිගට හරහට වක්‍රබදු පනවමින් ජනතාව ගිණි මැලයකට ඇදදමා ඇති බවත් කාබන් බද්ද වැඩිවන ජීවන බදු බරට එකතු වූ නවතම බද්ද වී ඇතැයි වෘත්තීය සමිති නායකයින් කීපදෙනෙකුට ශක්තියට පැවසීය.

දුම් සහතික ගාස්තු බද්ද එසේම තිබියදී එම කාරණයටම කාබන් බද්ද නමින් නව බද්දක් පැනවීමට විරුද්ධව බස්රථ හිමියන්ගේ සිට ලක්ෂ 82 ක් පමණ වන ත්‍රීරෝද රථ හා ලක්ෂ සංඛ්‍යාත යතුරු පැදි සංගම් මේවන විටත් රජයට බලපෑම් එල්ල කරමින් පවතින බව ශක්තියට වාර්තාවේ.

**සරත් රණසිංහ**

## කවි සිතුවිලි

**බොරදිය පොකුණ**

මිනිමරු කිඹුලන්
බොරකල පොකුණේ
රිලවු කුතු පහටුව
පස්වනක් ප්‍රීතියෙන්
පිනා ගොස්
සකල විධ පිනුම්
ගසමින්
උජාරුවෙන් පිහිනතිරු

**මංගල විජේසිංහ**



# අධිකරණය අපේ අත් පා නොබැන්දානම් ජනතාව රට අපට භාරදෙන්න සූදානමින් සිටියා

■ පාර්ලිමේන්තු මන්ත්‍රී - වාසුදේව නානායක්කාර

ආණ්ඩු බලය පවතින්නේ ජනතා පරමාධිපත්‍ය පිහිටුවා තිබෙන ආකාරයටයි. ව්‍යවස්ථාව අනුව ජනතා පරමාධිපත්‍ය තිබෙන්නේ පාර්ලිමේන්තුවට, ජනාධිපතිතුමාට අධිකරණයට හා ජනතාවගේ සර්වජන ඡන්ද බලයටයි. මේ අනුව ආණ්ඩු බලයක් පිහිටුවනු ලබන්නේ ජනාධිපතිතුමා විසින්ය. එය පාර්ලිමේන්තුවේ සනාථවීමට උවමනා වැඩි බලය තිබිය යුතුය. නැත්නම් ආණ්ඩුවක් ගෙනයා නොහැකිය. මන්ත්‍රීවරුන් 113ක් සිටින බව පෙන්වීම අනවශ්‍යය(ව්‍යවස්ථාව හෝ ස්ථාවර නියෝග අනුව)

දුම්රියක් එලවන එන්ජින් රියදුරා එම තනතුරෙන් ඉවත් කොට දුම්රියෙනුත් බැහැරට දැමුවාට පසු තමන් එන්ජින් රියදුරු බව කියමින් කෑමොරදීමෙන් පලක් නැහැ. ආණ්ඩුවේ කෝච්චිය යනවා රියදුරා බිම ඉදගෙන කෑමොර ගහනවා ඒකයි දැනට දැකිය හැකි ජවනිකාව.

මේක නීති ප්‍රශ්ණයක් හෝ ව්‍යවස්ථා ප්‍රශ්ණයක් නොවෙයි. මේක දේශපාලන බලය ගැන ප්‍රශ්ණයක් යූ.ඇන්.පී. - ශ්‍රී ලංකා ගිවිසුම අහෝසිකලා. ඒ නිසා ඇමති මණ්ඩලය විසුරුනා. අගමැති ඉවත්කලා, අළුත් අගමැති පත්කලා ඊලඟට අළුත් ඇමති මණ්ඩලය පත් වෙනවා.

වෙඩි තැබීම් මිනී මැරීම් වලින් පේනවා දේශපාලන තත්වයේ බරපතල කම. ඛනිජ තෙල් සංස්ථාවේ සේවකයන් රාජ්‍ය දේපොල රැක ගැනීමට නැගී හිටියා. එක් අයෙක් ජීවිතය පූජා කලා. රූපවාහිනී ආදී ජන මාධ්‍ය අංශවල සහ රටේ යථා තත්වය වසන් කිරීමට හිටපු රජයේ ඇමතිවරු දැරූ උත්සාහයන් සේවක පිරිස් එකතු වී ව්‍යර්ථ කලා. මේ ආණ්ඩු පෙරලියට ඇති සේවක සහයෝගීතාවය එයින් ඔප්පු උනා.

යූ.එන්පී. යට හිතවත් බටහිර තානාපති කාර්යාල මේ ආණ්ඩු පෙරලිය නීත්‍යානුකූලව සිද්ධ උනේ නැති බවට මැසිවිලි නගනවා.එසේ කරන්නේ රටේ නොසන්සුන් තත්වයක් ඇති කිරීම සඳහා අනුබල දීමකටයි. ආණ්ඩුවට ජාත්‍යන්තර පිලිගැනීම නැති කිරීමටයි. පාර්ලිමේන්තුවේ අපට නැති වුනත් අපි ඉන්නේ වැඩි බල තත්වයක. මේ බව 2018 පෙබ. 10 පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලය පෙන්නුවා. උසාවි තීන්දුවලින් පාර්ලිමේන්තුව විසුරුවාලීම අහෝසි කොට මහජන ඡන්ද බලය ප්‍රකාශවීම වැලකුවා අනික් අතට උසාවි තීන්දුවකින් අපගේ අමාත්‍ය මණ්ඩලය තහනම් කලා. එනිසා අපට උසාවි නොතකා හැර ඉදිරියට යාමට බැර වුනා. එනිසා අපගේ ආණ්ඩුවට අස්වීමට සිදු වුනා.

දැන් ජනාධිපතිතුමාගේ විධායක බලයයි, අති දැවැන්ත විපක්ෂ බලයයි අපි එකට ක්‍රියාත්මක කොට අපේ 113 හදාගෙන අපි නැවත බලය ගන්නට සූදානම් බව ජනතාවට කිව යුතුයැයි අපි පෙන්වා දුන්නා.

> **" අදත් හෙටත් යූ.එන්.පී. විරෝධී ස්ථාවරය අපට දේශපාලනයේ මගපෙන්වන එකම සාධකයයි. යූ.එන්.පී. බලය කැඩිය හැකි ප්‍රථම අවස්ථාවේදීම අපි එය කල යුතුය. ජනපතිත්, අගමැතිත් හිරේ දමනාවා කිවූ කුමන්ත්‍රණයට දැන් මොකදවෙලා තිබෙන්නේ? දැන් ක්‍රමන්ත්‍රණයක් නැහැ. ඔක්තොම්බර් 26 වුනේ ජනවරමෙන් බලයලත් ජනාධිපති අගමැති ලෙස මහින්දව පත් කලා. ඡන්දය වලකන්න උසාවිගිය උදවිය ජනතාවට පිටුපාලයි උසාවි ගියේ. කෝ කුමන්ත්‍රණයේ චෝදනා පත්‍රරෑ කෝ සිරදඬුවම්රෑ "**

යූ.එන්.පී. එකට මේ මොහොතේ බලය ගියත් ඒ බලය තහවුරු කර ගැනීමටය නොහැකි වන ලෙස අපි කටයුතු කරමු. මේ අර්බුදය හේතුව රනිල් සහ යූ.එන්.පී. ය අධිරාජ්‍යවාදීන්ට මේ රට පවාදීමට යද්දී නව ලිබරල් ආර්ථික ව්‍යසනය ජනතාව පෙලද්දී ජනාධිපතිතුමා ඊට එරෙහිව නැගී සිටීමයි. මහින්ද මහතා ඊට එකතු කර ගැනීමය.

,අපි නැවත ආණ්ඩුව භාරදී ඉවත් වෙන්නේ අධිකරණ තීන්දු නිසාත් - ඒ අනුව ජනවාරි සිට රාජ්‍ය වියදම සම්මත කරගැනිමේ අර්බුදය නිසා නැවත රට ගැන හිතලයි, යයි මහින්ද මහතා ජාතිය අමතා ප්‍රකාශ කලේය.

මේ රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව පරමාධිපත්‍ය නැත්නම් සංවෙරි බලය ඇත්තේ ජනතා වටය. ආණ්ඩුව හදන්නේ ජනාධිපතිවරයාගේ විධායක බලයෙනි. අධිකරණයට බලය ලැබෙන්නේ පාර්ලිමේන්තුව හරහාය. එහෙත් අධිකරණයේ තින්දුවට අප යටත් වියයුතුය. ජනතාව තමන්ගේ පරමාධිපත්‍ය බලය ප්‍රකාශ කරන්නේ සර්වජන ඡන්ද බලයෙන් මහ මැතිවරණ හරහාය. එයට අවස්ථාව ලැබුනේ නම් පලාත් පාලන ඡන්දයේ ප්‍රතිඵලය අනුව බැලුවත් ආණ්ඩු බලය ලැබෙන්නේ අපටය. ඒ අවස්ථාවයි මේ ආයෙත් අපෙන් උදුරගෙන තිබෙන්නේ.

එහෙම කියන අය අවසන් තේරුමෙන් යූ.එන්.පී. කාරයන්ට, හුරේ දමන්න උල්පන්දම් දෙන අය බවට පත්වෙනවා නේද? යූ.එන්.පී. , ජේ.වී.පී. , ටී.එන්.ඒ. කාරයන් උසාවිය හරහා මේ උදුරගෙන තිබෙන්නේ අපේ පරමාධිපත්‍යයයි.

ජනාධිපතිතුමා මහින්ද මහතාට ආණ්ඩුව බාර දෙමින් රනිල් ඉවත් කිරීම හරිද? යූ.එන්.පී. කාරයෝ කියන්නේ මෙය කුමන්ත්‍රණයක් බවයි. ඒ සඳහා අපට පාර්ලිමේන්තු බහුතරයක් නැති බවයි. පාර්ලිමේන්තු බහුතරය තියනවද? නැද්ද? බලන්න තමයි පාර්ලිමේන්තුව විසුරුවා මහ මැතිවරණයක් දියත් කරන්නේ, එයින් අපට බහුතරය එන නිසා තමයි යූ.එන්.පී , ජේ.වී.පී. , ටී.එන්.ඒ. කාරයන් එය වැලැක්වීමට උසාවි නීතිය යොදාගන්නේ.

අපි හැදුවේ පාර්ලිමේන්තුව විසුරුවා නිදහස් සාධාරණ මැතිවරණයක් පවත්වන අන්තර් කාලීන ආණ්ඩුවක් ලෙස ක්‍රියා කිරීමයි.

දින 50 කට අඩු කාලයක් තුලත් යූ.එන්.පී. පාලනයෙන් නැති කරපු සහන ගණනාවක්ම දෙන්න අපට පුළුවන් වුනා.මිල සහනල බදු සහනල පොහොර සහනාධාර ඒ අතර විය.

අපේ ඉදිරි මහ මැතිවරණයන් සහ පලාත් සභා ඡන්ද ලබා ගැනීමේ මහා ජාතික අරගලය ගෙනයමින් පාර්ලිමේන්තුවෙත් - රටපුරාමත් - අධිකරණය තුලිනුත් අපිත් ක්‍රියාත්මකයි. අපි ජනාධිපති සමඟ සිටින බලවත් විපක්ෂයක් - මේක අළුත් තත්වයක් රට පාවා දෙන ජනතාව පාගන නීතිගෙ ’න විට ආණ්ඩුව හිරකරන හයියක් දැන් අපට තියනවා.

හරි බහුතරයක් පාර්ලිමේන්තුවේ නැතිව රනිල් ආණ්ඩුව බාර ගත්තේ ඇයි? ඒක ප්‍රජාතන්ත්‍රවාදීද? කියා සමහරු අහනවා. යූ.එන්.පී. පාලනය නිසා රටේ ජනයාගේ දෛනික ජීවිතය පත්තුවෙලා ගිනි අවිලෙද්දී පාර්ලිමේන්තු මැතිවරණයක් උදෙසා බලය බාර ගැනීම අපට පැහැර හැරිය නොහැකි වගකීමක් - ඒ වෙලේ 113 හරි බහුතරය බලබලා ඉන්න පුළුවන් කමක් නැහැ. අද රනිල්ටත් 113 බහුතරය නැහැ. අද ඔහු රැකෙන්නේ විපක්ෂයේ අය කුලියට අරගෙන.

පොදුජන පෙරමුණ පක්ෂය ශ්‍රී.ල.නි.ප. ය හා අපි ඇතුළු සෙසු පක්ෂ එක්ව මහා සන්ධානයක් හදනු ඇත. හැදිය යුතුය. නැතහොත් සතුරාට අපි ගොදුරු වනු ඇත.

දින 50 පමණ කාලයක් තිබුනේ ව්‍යවස්ථා අර්බුදයක් නොවේ. මහ මැතිවරණයක ජනතා අපේක්ෂාව ඉටු කිරීමට අප දැරූ ප්‍රයත්නය සහ රනිල්ගේ යූ.එන්.පී. සතුරු බලය ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයට මුවාවී ප්‍රතිගාමී බලය රැක ගැනීමට ගෙන ගිය අරගලයයි. උසාවියේ තීන්දුවෙන් අප අත්පා බැන්දේ නැත්නම් මේ වන විට මැතිවරණ කටයුතු අවසන්වෙලා යූ.එන්.පී. මෙහෙයුම් මෙල්ල කරන්න අපේ ජන බලය සිටියේ සූදානමින්ය.

මේ බල පෙරලියේ ජ.වි.පෙ. යූ.එන්.පී.යට කල බැල මෙහෙවර මකා දැමිය නොහැකි ලෙස ඉතිහාසයේ සටහනක් වෙනවා. එය වාග් මාලාවෙන් මකා දැමිය නොහැක. අදත් හෙටත් යූ.එන්.පී. විරෝධී ස්ථාවරය අපට දේශපාලනයේ මගපෙන්වන එකම සාධකයයි. යූ.එන්.පී.

## දින 50 ව්‍යවස්ථා අර්බුදයක් නැහැ

බලය කැඩිය හැකි ප්‍රථම අවස්ථාවේදීම අපි එය කල යුතුය.

ජනපතිත්, අගමැතිත් හිරේ දමනාවා කිවූ කුමන්ත්‍රණයට දැන් මොකදවෙලා තිබෙන්නේ? දැන් ක්‍රමන්ත්‍රණයක් නැහැ. ඔක්තොම්බර් 26 වුනේ ජනවරමෙන් බලයලත් ජනාධිපති අගමැති ලෙස මහින්දව පත් කලා. ඡන්දය වලකන්න උසාවිගිය උදවිය ජනතාවට පිටුපාලයි උසාවි ගියේ. කෝ කුමන්ත්‍රණයේ චෝදනා පත්‍රරෑ කෝ සිරදඬුවම්රෑ

නැවත අගමැති ලෙස පත්වූ රනිල් උසාවියට, කටුනායකට, බටහිර තානාපතිවරුන්ට ස්තූති කලා. තනාපතිවරුද රනිල් නැවත අගමැති වී ආණ්ඩුව ගැනීම ගැන ඔවුන්ගේ සතුට පලකලා. ඒ වගේම තනාපතිවරුන් ද උසාවියට හා කටුනායකට ස්තූති කලා.

නීතියේ වගන්ති කනපිට හරවලා සුමන්තිරන්ලා විපක්ෂ නායකකම ගන්න උසාවි යනවා කිව්වේ ඒ ගොල්ලන්ගේ මහ ගෙදර යනවා කියා හිතාගෙනය. ආණ්ඩු පක්ෂයට 103 ක් තිබියදී පැහැදිලිව 98 තිබෙන මහින්ද මහතාගේ විපක්ෂයට විපක්ෂ නායකකමත් අහිමි කල නොහැකිය. තවත් මාස 03 ක් යනවිට මේ ආණ්ඩුව බිඳවැටෙනවා නැතහොත් එයින් ගැලවීමට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ යෝජනාව ගෙන එන්න සිද්ධ වෙනවා. පාර්ලිමේන්තු ඡන්දයත් අපේ අමාත්‍ය මණ්ඩලයත් තහනම් කරවා

## ප්‍ර.වා.පෙ 07 වන නියෝජිත සමුළුව 2019 මාර්තු 23 සහ 24 දින කොළඹදී

ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නියෝජිත සම්මේලනය 2019 මාර්තු 23 සහ 24 දෙදින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට තීරණය කර ඇති බව වාර්තාවේ.

මෙවර සම්මේලනයේදී දේශපාලන යෝජනාව, සංවිධායක යෝජනාව, භාණ්ඩාගාර වර්ධනය ගැන දීර්ඝව සාකච්ඡා කර ක්‍රියාමාර්ග සම්මත කර ගැනිමටද, ඉදිරිතලයට නව මධ්‍යම කාරක සභාවක් පත්කර ගැනිමටද නියමිතව තිබේ.


මෙම සම්මේලනයට උතුරු, නැගෙනහිර ඇතුළු සියලු පලාත් වලින් ජනවාර්ගික නියෝජිතයන් සහිතව සහභාගිවීමට නියමිතව ඇති අතර, ප්‍රදේශියව මතුවී ඇති දේශපාලන වර්ධනයන්ද එම නියෝජිතයන්ට මතුකිරීමට ඉඩකඩ විවෘත කර දී ඇති බවද, සංවිධායක ලේකම් සරත් පද්මදාස සහෝදරයා **ශක්තියට** වාර්තා කර ඇත.

## අපගේ ශෝකය

**බටහිර කලටුවාව විසු ප්‍ර.වා.පෙ ක්‍රියාකාරි සමාජිකයකු වන කේ.පී ජයතිස්ස සහෝදරයාගේ ආදරණිය මැණියන් පසුගියදා අප අතරින් වෙන්විය. ඒ පිළිබඳව අපගේ ශෝකය පලකරමු.**

**නාඳුරන, කිරිගෝරාව විසු ප්‍ර.වා.පෙ ක්‍රියාකාරි සමාජිකයකු වන එච්.එම්.එන් බණ්ඩාර සහෝදරයා කුඩා අවධියේ සිට වාමාංශික දේශපාලනයට කැපවී කටයුතු කල අතර 1970 සිට වාසුදේව සහෝදරයාගේ මැතිවරණ ක්‍රියාකාරිත්වය සමඟ එක්ව කටයුතු කල සටන්කාමි නායකයෙකි. ඔහුගේ වියෝව පිළිබඳව අපගේ ශෝකය පලකරමු.**

**බදුවත්ත, බොරළුව විසු නීල් සමරවීර සහෝදරයා පසුගිය දිනක අප අතරින් වියෝ විය. එම සහෝදරයා වාමාංශික දේශපාලන දහරාවේ කැපවී කටයුතු කල අයෙකි. ඔහුගේ වියෝව පිළිබඳව අපගේ ශෝකය පලකරමු.**



## ශක්තියට ආධාර කරන්න

මුල්‍ය දුෂ්කරතා අභිබවමින් මාස්පතා ශක්තිය ඔබ වෙත එවිමට අපි වෙහෙසෙමු. ශක්තිය පුවත්පත පවත්වාගෙන යෑම වෙනුවෙන් ඔබ ලබාදෙන වාර්ෂික දායක මුදල් හා ආධාර නිතිපතා අප වෙත ලබාදෙන්න. ඔබගේ මුදල වෙනුවෙන් රිසිට් පතක් නිකුත් කරනු ලැබේ. සියලු මුදල් පහත දක්වන අකාරයට එවන ලෙස ඉල්ලමු. මුදල් ඇණවුම් කුරුදුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකිවන පරිදි එවන්න.

**එම්.බි. සරත් පද්මදාස**
කලමනාකරු
ශක්තිය

49/1, විනයලංකාර මාවත,
කොළඹ 10.

ජනතාව ප්‍රාණ ඇපයටගත්

ශක්තිය

### රජයේ නොහැකියාව ?

දිගු කලක් තිස්සේ ඇ.ඩො සාපේක්ෂව රුපියලේ අගය ඉතා ශ්‍රීඝ්‍රයෙන් අව ප්‍රමාණය වෙමින් තිබිණ. මේ අනුව ඉකුත් සතියේ (පෙබරවාරි 01 පෙර) ඩොලරයක් විකුණුම් මිල රු: 184 ක්ද ඉක්මවීමට ආසන්නව තිබිණි. එහෙත් පෙබරවාරි 01 වැනිදා ඩොලරයක විකුණුම් මිල රු: 180.19 ලෙසද ගැණුම් මිල රු: 176.34 ලෙසද සටහන්ව තිබුණි. මේ අකාරයට රුපියල ශක්තිමත් වී මාස කිහිපයට පසු ඩොලරයේ විකුණුම් මිල රුපියල් 178.83 ලෙස හා ගැණුම් මිල 174.98 ලෙස මහ බැංකුව ප්‍රකාශයට පත්කර තිබුණි. මෙය ශ්‍රීලංකා ආර්ථිකයට ඉතා සතුටු දායක තත්වයක් වුවද රජයට එය පවත්වාගෙනයාමේ හැකියාවක් නැති බව අප සඳහන් කරන්නේ එක් දිනක් තුල ඩොලරයේ විකුණුම් මිල රුපියලකටත් වඩා වැඩි වී රුපියල අව ප්‍රමාණය වීම නිසාය. 2019 පෙබරවාරි 06 වනදා ඩොලරයක විකුණුම් මිල 179.97 ලෙසද ගැණුම් මිල 176.12 ලෙසද මහාබැංකුව වාර්තා කර තිබුණි. මේ අනුව ඩොලරායේ වටිනාකම එක් දිනක් තුල රු 1.14 කින්වි වැඩිවී තිබුණි.

# වතු කම්කරු සටන කොළඹ ආක්‍රමණය කරයි

## කම්කරු ශ්‍රමයෙන් රු: ලක්ෂ 05ක දීමනා ලබන රාජදුරෙයි කම්කරුවන්ගේ රු: 1,000ට ගොරවයි

## රාජදුරේයිගේ ගෙම්බර් පිටුපස ධම්මික පෙරේරාත්

මෙවනදා වතු කම්කරු සටන් සිමාවුයේ වතුකරයට වුවත් මෙවර රුපියල් 1,000 මාසික වැටුප් සටන කොළඹ නගරය ආක්‍රමණය කර තිබිම තිබීම විශේෂ සිද්ධියකි.

වතු යටිතල ඇමැති දිගම්බරන් ජනවාරි 0වෙනදා ලංකා පුවත් පත සමඟ කල සාකච්ඡාවේදි ප්‍රකාශකර තිබුණේ වතු කම්කරුවන් රුපියල් 1,000 මාසික වැටුප් ඉල්ලීම අසාධාරණ බවයි. ඇමැති පට්ටම් ලැබීමට පෙර වතු සමාගම් වතුකරයෙන් පන්නා දැමීමට පාරම් බෑ අයුරු කාටත් මතකය. වතුකරයේ ඉපදී හැටන් නගරයේ හෝටලයක ටි මේකර් ලෙස දිවිගෙවමින් සිටියදි, වතු කම්කරුවන්ගේ කතිරයේ මහිමයෙන් ඇමැතියකු වී අද කොම්පැනි වල ලාභය වෙනුවෙන් පෙනීසිටිම පුදුම ඉරණම්කාර ක්‍රියාවක් බව කුඩා වතු සමිති නායකයන් පවසයි.

ඊට දින කිහිපයකට පසු වැවිලි කරුවන්ගේ සභාපති රෝෂාන් රාජදුරෙයි කොළඹ ප්‍රවෘත්ති සාකච්ඡාවකදී  ප්‍රකාශ කලේ, රුපියල් 1,000 වැටුප් ඉල්ලීම අසාධාරණයක් බවය, කැලණි වැලි වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිළධාරියාය වන මොහුගේ මාසික වැටුප හා දීමනා ලක්ෂ 05 ඉක්මවයි. රාජදුරෙයි කොතරම් බල පුළුවන් කාරයෙක් දැයි කිවහොත් වැවිලි ඇමැතිවරයා කැඳවන සාකච්ඡාවකට පවා ඔහු එන්නේ නැත. රාජදුරෙයිගේ ගෙම්බර් පිටුපස ඉන්නේ කැළණි වැලිය අයිති ධම්මික පෙරේරාය. රාජදුරෙයි තවදුරටත් දින 07ක වැඩවර්ජනය හේතුවෙන් සමාගම් වල දින 07ක පාඩුව රුපියල් කෝටි 175 වැඩි බවය.

කම්කරු පවුල් මේ දිනවල දිවි ගැට ගසා ගැනිමට තම බඩු මුට්ටු උකස් කිරීම ඊට වඩා බරපතලයග වතු කම්කරු වැටුප් පිළිබද




සාකච්ඡාවට ආණ්ඩුවේ හැදු කමිටුවේ සභාපති අගමැතිය. විත්ති කූඩුවට පලමුවෙන්ම දැමිය යුත්තේ ඔහු බව ප්‍රගතිශීලි නිතීඥවරු කීහ.

රෝෂාන් රාජදුරෙයි කියන්නේ තමන් සාකච්ඡා කරන්නේ වතු වෘත්තීය සමිති සමඟ පමණක් බවත්, රජය තමන්ට අදාළ නොවන බවය. මොන බයිල ගැහුවත් ආණ්ඩුව ඉන්නේ ධනපති කොම්පැනි කාරයන් සමඟය. රුපියල් 1,000 ජනවාරි 23 වනදා රටපුරා ස්ථාන 27ක පැවැත්වූ උද්ඝෝෂණ සහ සිමිත වැඩවර්ජන සාර්ථක වු බව රුපියල් 1,000 වැටුප් දිනීමේ බහුජන ව්‍යාපාරයේ ධම්මික මුණසිංහ සඳහන් කරයි.

ජනවාරි 23 වැනිදා කොළඹදී විරෝධතා පාගමන හා විරෝධතා රැලියට විශාල පිරිසක් සහභාගි වී සිටි අතර, පිටකොටුව බස් නැවතුම් පොල මාර්ග යේ මංතිරු තිරු 2ක් අවහිර කරමින් සටන්කාමී උද්ඝෝෂණයක් පැවැත්විණි. කොළඹ ගැස්පහ හන්දියෙන් ආරම්භ වු විරෝධතා පෙලපාලිය වරාය ඉදිරිපිටින් මල්වත්ත හරහා පිටකොටුව බෝගහ ඉදිරිපිටට පැමිණ බලවත් විරෝධතාවයක නිරත වු අතර මේ හේතුවෙන් අවට ප්‍රදේශ කිහිපයක වහාන තද බදයක් පැවැතිණි. ජන 26 දිනද නාවලපිටිය හා ගම්පොළල පුස්වැල්ලාව ආදී ප්‍රදේශ වල වතු කම්කරු  උද්ඝෝෂණ පැවැත්විණි.

මෙකී විරෝධතාවන්ට ප්‍රතිචාරයක් නොදැක්වුවහොත් කුමක් කලයුතු දැයි වෘත්තීය සමිති හා බහුජන සංවිධාන 30හි විධායක කමිටු රැස්ව තීරණය කරන බවත්, රුපියල් 1,000 ලබාදෙනතෙක් නොනවත්වා අරගලය ඉදිරියට ගෙනයන බවත්ය. මෙතෙක් වතුකරයට සිමාවී තිබු වතු සටන් ඉදිරියේ නගර වටලන සටනක් බවට පරිවර්තනය කරන බවත් ඔහු මා සමඟ ප්‍රකාශ කලේය.

**ටිකිරි දිසානායක**
**හිටපු ප්‍රධාන ලේකම්**
**එක්සත් වැවිලි සේවා සේවක සංගමය**

## රාජ්‍ය සේවයේ අවම වැටුප රු: 50,000/= කරනු!

## අඩු ආදායම් ලාභීන්ට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහන මිලට දෙනු

**ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ**

කොලඹ 10, ස්ටාර් මුද්‍රණාලයේදි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි